ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා

SLAASMB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# වාර්ෂික වාර්තාව 2020

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මඟින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ.
(63 පිටුව බලන්න )

# පටුන


මණ්ඩලයේ සාමාජිකයින්....01
2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සාමාජිකයින්....02
2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ නිරීක්ෂකයින්/ආරාධිතයින්....06
2020 තුළදී මණ්ඩලය පත්කල කමිටු සහ උප කමිටු .... 07
මණ්ඩලයේ වර්තමාන කාර්‍ය මණ්ඩලය.... 08
තාක්ෂණික කාර්ය මණ්ඩලය.... 09
ක්‍රියාකාරකම් සමාලෝචනය 2020....10
2020 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය මත කරනු ලැබූ නිරීක්ෂණ .... 20
2020 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන්.... 22
2020 තුළදී විගණන පරීක්ෂණ.... 23
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්යය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන හා මධ්‍ය කාලීන පියවර.... 28
කාර්යය සාධන ලකුණු පත.... 30
2020 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ (SBE's) මූල්‍ය ප්‍රකාශන.... 32
2020 වර්ෂයේදී සමාලෝචනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද, නිරීක්ෂණ සහිත බැවින් උපකාරක ලිපි මගින් දැනුම්දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ (SBE's) මූල්‍ය ප්‍රකාශන.... 38
2020 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ලද ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ අස්ථිත්වයන්.... 42
2020 වර්ෂය තුලදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්.... 43
විගණකාධිපති වාර්තාව.... 45
විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්වය .... 49
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය .... 52
මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් වීස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය .... 53
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය .... 54
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය .... 55
මූල්‍ය ප්‍රකාශනවලට සටහන් .... 56
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් .... 63

# වාර්ෂික වාර්තාව - 2020

## මණ්ඩලයේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| **කේ එම් ඒ එන් දවුලාගල මිය** *FCMA (UK), MBA (USJP) MSc (Fin. and Busi. Econ.)(UK)*<br>සහකාර අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව | සභාපතිනිය<br>(2020 පෙබරවාරි 28 දින සිට) | |
| **ඩී එන් ආර් සිරිවර්ධන** *B.A (Hons), LLB , LLM,* නීතීඥ<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | නිල බලයෙන් සාමාජික<br>(2021 ජනවාරි 2 දින දක්වා) | |
| **ඒ එන් ගුරුගේ** *B.Sc, B. Admin* | නිල බලයෙන් සාමාජික<br>(2020 නොවැම්බර් 06 දින දක්වා) | |
| **එච් එම් ඩබ් සී බණ්ඩාර** *B.Com (Sp.), LLB, Attorney -at -Law*<br>කොමසාරිස් ජනරාල් - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | (2020 දෙසැම්බර් 04 දින සිට) | |
| **සී මෙන්ඩිස්** නීතීඥ<br>අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් සාමාජික<br>(2020 මැයි 26 දින සිට) | |
| **ඩබ් ඩබ් ජේ සී පෙරේරා** *FCA, FCMA, B.Sc (B.Admin), CFE*<br>හවුල්කරු, කේ පී එම් ජී | පත්කල සාමාජික<br>(2020 පෙබරවාරි17 දින සිට) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **එච් එම් ඒ ජයසිංහ** *FCA, FCMA, CIPFA*<br>සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, දේශීය කළමණාකරණ හවුල්කරු, අර්නස්ට් සහ යංග්, ශ්‍රී ලංකාව සහ මාලදිවයින | පත්කල සාමාජික<br>(2020 පෙබරවාරි 17 දින සිට) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **එස් එම් එස් එස් බණ්ඩාර** *FCA, MBA (Col.) B.Sc Acc. and Fin. Management (USJP)*<br>උප සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය,<br>හවුල්කරු, බී. ආර් ද සිල්වා සහ සමාගම | පත්කල සාමාජික<br>(2020 පෙබරවාරි 17 දින සිට) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **පී ආර් ඒ අයි ගුණරත්න** *ACMA (UK), CGMA, ACCA Affiliate, Dip.in Banking and Fin., B.Sc. Eng. (Hons), MBA (UK)*<br>මූල්‍ය ප්‍රධානි - රිසස් එනර්ජි පොදු සමාගම | පත්කල සාමාජික<br>(2020 මාර්තු 2 දින සිට) | එක්සත් රාජධානියේ වරලත් කලමනාකරණ ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා අංශය |
| **ආර් ටී අමරසූරිය** *LLB (Hons.) (Col.), FCMA (UK), FCMA (SL), CGMA* නීතිඥ<br>ලේකම් - ශ්‍රී ලංකා නීතිඥ සංගමය, හිටපු කොමසාරිස්වරයෙකි<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ හිටපු සාමාජික | පත්කල සාමාජික<br>(2020 ජූනි 9 දින සිට) | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| **පී ඩී සමරසිංහ** *FCA, FCMA (UK), MBA*<br>සමූහ අධ්‍යක්‍ෂක/ප්‍රධාන විධායක නිළධාරි -<br>ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පොදු සමාගම | පත්කල සාමාජික<br>(2020 ජූලි 2 දින සිට) | ලංකා වාණිජ මණ්ඩලය |
| **කේ කේ එස් ගුණවර්ධන** *BA (Hons.) Econ. Sp., Dip.in Hypermedia Eng.(Col.), Dip.in Multimedia Technology (Col.), PGDip in Busi. and Fin. - ICA (SL)*<br>කළමණාකාර අධ්‍යක්‍ෂක /<br>ප්‍රධාන විධායක නිළධාරි - ග්‍රැෆික් සිස්ටම්ස් (පෞද්) සමාගම | පත්කල සාමාජික<br>(2020 ජූලි 3 දින සිට) | ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සම්මේලනය |
| **ඒ ගුණසේකර** *FCA, FCMA, MBA (USJP)*<br>ජ්‍යෙෂ්ඨ උප සභාපති, සංකලනිත අවදානම් කළමණාකරණ/<br>ප්‍රධාන අවදානම් නිළධාරි - ඩී.එෆ්.සී.සී. බැංකුව | පත්කල සාමාජික<br>(2020 පෙබරවාරි 12 දින සිට) | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය |
| **මහාචාර්ය ඒ ජයමහ** *PhD (USQ-Aus), M.Com (UoK), B.Com (UoK), FCA*<br>පීඨාධිපති - පශ්චාත් උපාධි පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය | පත්කල සාමාජික<br>(2020 මැයි 26 දින සිට) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| **එම් ඩී පී එල් පෙරේරා මිය** *FCA, MBA* | | මණ්ඩලයේ ලේකම් |

PS/SP/SB/චක්‍රලේඛ 02/2019 දරණ ජනාධිපති චක්‍ර ලේඛණයට අනුව, මණ්ඩලයේ කලින් සිටි සාමාජිකයින් 2019 නොවැම්බර් 29 දින සිට ඉල්ලා අස්වූ අතර නව සාමාජිකයින් පත්කිරීම 2020 දී සිදුවිය.

# මණ්ඩලයේ සාමාජිකයන්

2020 දෙසැම්බර් 31 දිනට



**කේ එම් ඒ එන් දවුලාගල මිය**

*FCMA (UK), MBA (USJP)*

*MSc (Financial and Business Economics), University of Essex, UK*

මණ්ඩලයේ සභාපතිනිය වන දවුලාගල මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරියකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ෂ 30 කට වැඩි කාලයක් සේවය කරන දවුලාගල මිය මූල්‍ය, විගණන, සංචිත කළමණාකරණය, නියාමනය සහ සුපරීක්ෂණය, සාර්ව විකෂණ සෝදිසි කිරීම්, මානව සම්පත් කළමණාකරණය සහ අවදානම් කළමණාකරණය යන ක්ෂෙත්‍රවල නියැලීමෙන් මනා පලපුරුද්දක් ලබා තිබේ.



**ඩී එන් ආර් සිරිවර්ධන**

*B.A. (Hons.), LLB, LLM, නීතීඥ*

සිරිවර්ධන මහතා 1988 දී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට සම්බන්ධ විය. ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස කටයුතු කරන අතර ඔහුට සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වසර 33 කට අධික කාලයක පලපුරුද්ද ඇත. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ සාමාජිකයකු ද වේ.



**එච් එම් ඩබ්ලිව් සී බණ්ඩාර**

*B.A. (Hons.), LLB, LLM, නීතීඥ*

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වන බණ්ඩාර මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වර්ෂ 33 කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු දෙපාර්තමේන්තුවේ රැමිස් (RAMIS) (ආදායම් පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය) ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇති අතර, එහි මූලික කණ්ඩායම් සාමාජිකයෙක් ද වේ. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජිකත්වය දරනු ලැබේ.



**සී. මෙන්ඩිස්**

*නීතීඥ*

මෙන්ඩිස් මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

# මණ්ඩලයේ සාමාජිකයන්

2020 දෙසැම්බර් 31 දිනට



**ඩබ් ඩබ් ජේ සී පෙරේරා**

*FCA, FCMA, B.Sc (B.Admin), CFE*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයකු වන පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ කේපීඑම්ජී ආයතනයේ හවුල්කරුවකු වේ. ඔහු කේපීඑම්ජී ආයතනයේ අවදානම් උපදේශන සහ ව්‍යවහාරික සේවා අංශයේ ප්‍රධානියා වේ.

ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමය පිලිගත් සහතිකලත් වංචා විමර්ශකයකු සහ ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.



**එච් එම් ඒ ජයසිංහ**

*FCA, FCMA, CIPFA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා වන ජයසිංහ මහතා අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ දේශීය කළමණාකරණ හවුල්කරුවකු වේ. ඔහු අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ බැංකුකරණ සහ මූල්‍ය සේවා පරිචය භාර සහතික කිරීමේ ප්‍රධානියා ද වේ.

ජයසිංහ මහතා ගිණුම්කරණය සහ විගණනය පිළිබඳව අවුරුදු 38 කට අධික කාලයක පුළුල් පළපුරුද්දක් ලබාගෙන ඇති අතර, දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා වශයෙන් ද කටයුතු කරයි. ඔහු වෙනත් ව්‍යවස්ථාපිත ආයතන, වෘත්තීය සංගම් සහ අධ්‍යාපන ආයතන බොහොමයක සාමාජිකයෙකු වශයෙන් ද සේවය කරයි. ලැයිස්තුගත සමාගම් කිහිපයක විගණන කමිටුවලට උපදේශකවරයෙකු ලෙස ද ඔහු සේවය කරයි.



**එස් එම් එස් සංජය බණ්ඩාර**

*FCA, MBA (Colombo) B.Sc Accountancy and Financial Management (USJP)*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ උප සභාපතිවරයා වන බණ්ඩාර මහතා වරලත් ගණකාධිකාරීන් වන බී ආර් ද සිල්වා සහ සමාගමේ හවුල්කරුවකු වන අතර සහතික කිරීමේ සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිලිබඳ විශේෂත්වය ලබමින් පරිචයෙහි වසර 23 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත.

ඔහු ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සහ දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) මණ්ඩල සාමාජිකයකු ලෙසද කටයුතු කරයි. තවද, ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු වේ.



**පී ආර් ඒ අයි ගුණරත්න**

*ACMA (UK,) CGMA, ACCA Affiliate, Dip. in Banking and Finance, B.Sc. Eng. (Hons), MBA (UK)*

රිසස් එනර්ජි පොදු සමාගමේ මූල්‍ය ප්‍රධානි වන ගුණරත්න මහතා මූල්‍ය සහ ගණකාධිකරණ ක්ෂේත්‍රයේ වසර 10 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත.

අතීතයේ දී, ඔහු බ්‍රැන්ඩික්ස් සමූහයේ සහ කේපීඑම්ජී ආයතනයේ සේවය කොට ඇත. ඔහු ජාත්‍යන්තර සහතිකලත් වෘත්තීය ගණකාධිකාරීන්ගේ සංගමයේ මැදපෙරදිග, දකුණු ආසියා සහ උතුරු අප්‍රිකා ප්‍රාදේශීය උපදේශක මඩුල්ලේ සාමාජිකයකු වන අතර, සීඅයිඑම්ඒ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරයෙක් වේ. ඔහු ශ්‍රී ලංකාව, බුරුමය, වියට්නාමය, නයිජීරියාව සහ ආසියා ශාන්තිකර කලාපය ඇතුළුව විවිධ භූගෝලීය කලාපවල සීඅයිඑම්ඒ ආයතනයේ දේශන පවත්වා ඇත.

# මණ්ඩලයේ සාමාජිකයන්

2020 දෙසැම්බර් 31 දිනට



**ආර් ටී අමරසූරිය**

*LLB (Hons.) (Colombo), FCMA (UK), FCMA (SL), CGMA,*
*නීතිඥ*

අමරසූරිය මහතා අභියාචන නීතියේ සියළුම පැතිවල මෙන්ම ව්‍යවස්ථාපිත සහ පොදු නීතිය පිළිබඳ විශේෂත්වය ලබමින් ශ්‍රී ලංකාවේ අභියාචන අධිකරණවල නිත්‍ය වෘත්තියෙහි නියැලෙන්නෙකු වන අතර සිවිල්, ගිවිසුම්, වාණිජ, දේපල, බදු, බැංකු, කම්කරු ඇතුලත් විවිධාංගිකරණය වූ ක්ෂේත්‍ර සහ විෂයයන්වල සහ අනෙකුත් නීති ශික්ෂණයන්හි ද පරිචයක් ඇත.

2013 දී, අවුරුදු 40 න් පහළ සීඅයිඑම්ඒ ආයතනයේ වඩාත් කැපී පෙනෙන සාමාජික (ශ්‍රී ලංකා) ලෙස වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සීඅයිඑම්ඒ ආයතනයේ තරු රන් සම්මානය ඔහුට පිලිගන්වනු ලැබූ අතර 2021 සඳහා එල්එම්ඩී - සීඅයිඑම්ඒ පුරෝගාමී කෙනෙකු ලෙස මෑත දී නම් කරනු ලැබීය.

ඔහු ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ ලේකම්, කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සභාපති, ශ්‍රී ලංකා සංස්ථාපිත නීති අධ්‍යාපන මණ්ඩලයේ සාමාජික, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අධ්‍යාපන ස්ථාවර කමිටුවේ සාමාජික, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ නීති පීඨයේ උපදේශක මණ්ඩලයේ සාමාජික සහ ශ්‍රී ලංකා ජාතික බේරුම් කිරීම් මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ සාමාජික ලෙස සේවය කරයි. ආසියා ශාන්තිකර නීති සංගමයේ විධායක කමිටු සාමාජික ලෙස ද ඔහු සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) හිටපු කොමිෂන් සාමාජිකයෙකු වේ.



**කේ කේ එස් ගුණවර්ධන**

*BA (Hons.) Economics Sp., Dip.in Hypermedia Engineering (Colombo), Dip.in Multimedia Technology (Colombo), PGDip in Busi. and Fin. - ICA (SL)*

ග්‍රැෆික් සිස්ටම්ස් (පෞද්) සමාගමේ සභාපති/ කළමණාකාර අධ්‍යක්ෂක වන ගුණවර්ධන මහතාට මුද්‍රණ කර්මාන්තය, තොරතුරු තාක්ෂණය, ගණකාධිකරණ සහ මූල්‍ය යන ක්ෂේත්‍රවල වසර 35 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.

දැනට ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සහ ප්‍රවර්ධන උපදේශන කමිටුවේ සභාපතිවරයා වේ. ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ උප සභාපතිවරයා ද වන අතර තවත් බොහෝ සමාගම් සහ සංගම්වල මණ්ඩල වල සේවය කරයි. ගුණවර්ධන මහතා 1999 සහ 2001 දී වර්ෂයේ ශ්‍රී ලංකා ව්‍යවසායකයා සම්මානය ඇතුළුව බොහෝ සම්මාන ලාභියෙකි.



**ඒ ගුණසේකර**

*FCA, FCMA, MBA (USJP)*

ඩීඑෆ්සීසී බැංකුවේ ජ්‍යෙෂ්ඨ උප සභාපති, සංකලනීත අවදානම් කළමණාකරණ ප්‍රධාන අවදානම් නිළධාරී වන ගුණසේකර මහතාට බැංකු කර්මාන්තයේ මූල්‍ය කළමනාකරණ මූල්‍ය මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ යන ක්ෂේත්‍රවල වසර 36 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු හැටන් නැෂනල් බැංකුව පොදු සමාගමේ ප්‍රධාන මූල්‍ය නිළධාරී සහ ඩීඑෆ්සීසී බැංකු පොදු සමාගමේ ජ්‍යෙෂ්ඨ උප සභාපති/ ප්‍රධාන මූල්‍ය නිළධාරී ලෙස කලින් සේවය කර ඇත.

ඔහු ඩීඑෆ්සීසී සමූහයේ සමාගම් කිහිපයක මණ්ඩලවල සහ මණ්ඩල උප කමිටුවල ද සේවය කරයි.

# මණ්ඩලයේ සාමාජිකයන්

2020 දෙසැම්බර් 31 දිනට



**පී ඩී සමරසිංහ**

*FCA, FCMA (UK), MBA*

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ දේපල සමාගමක් වන ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පොදු සමාගමේ සමූහ අධ්‍යක්‍ෂක/ ප්‍රධාන විධායක නිළධාරි වන සමරසිංහ මහතා නිෂ්පාදන, වැවිලි සහ මූර්ත දේපල යන ක්‍ෂෙත්‍රවල වසර 30 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත. ඔහු ප්‍රසිද්ධ ලයිස්තුගත සහ ලයිස්තුගත නොවන සමාගම් කිහිපයක මණ්ඩලවල සහ මණ්ඩල උප කමිටුවල සාමාජික ලෙසද සේවය කරයි.

සමරසිංහ මහතා, ශ්‍රී ලංකා අධ්‍යක්‍ෂකවරුන්ගේ ආයතනය, ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය, ශ්‍රී ලංකා කර්මාන්ත සංගමය සහ ශ්‍රී ලංකා ස්වාධිපත්‍ය සංවර්ධකයන්ගේ සංගමය වැනි බොහෝ සංවිධානවල හිටපු සභාපතිවරයා වේ. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ශ්‍රී ලංකා අංශයේ) හිටපු සභාපතිවරයකු වන අතර වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) හිටපු පාලක මණ්ඩල සාමාජිකයෙකි. තවදුරටත්, ඔහු ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු මණ්ඩල සාමාජිකයෙකි.



**මහාචාර්ය ඒ ජයමහ**

*PhD (USQ-Aus), M.Com (UoK), B.Com (UoK), FCA*

කැලණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යයනාංශයේ ගණකාධිකරණය පිලිබඳ මහාචාර්යවරයා වන මහාචාර්ය ජයමහ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ද වේ. ඔහුට කැලණිය විශ්ව විද්‍යාලයේ වසර 38 කට වඩා වැඩි සේවයක් ඇති අතර ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨයේ සහ මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන පිඨයේ, ගණකාධිකරණ අධ්‍යයනාංශ ප්‍රධානි ලෙස ද, ව්‍යාපාර අධ්‍යයන ශාස්ත්‍රපති වැඩසටහනේ සම්බන්ධිකාරක ලෙස ද සේවයකොට ඇත. ඔහුට දර්ශනපති ආචාර්ය උපාධිය 2010 දී පිරිනැමිනි. ඔහු පරිචයෙහි නියුක්ත වන අතර, ජයමහ පුෂ්පකුමාර සහ සමාගමේ ප්‍රධාන හවුල්කරු ද වේ. ඔහු ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් කරගෙනයන ලද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පිලිබඳ ආයතන විමර්ෂණයේ විමර්ෂකයෙකු ලෙස සේවය සපයන ලද අතර 2020 සිට එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්‍ෂකවරයෙක් ලෙසත් සේවය කරයි.

# මණ්ඩලයට නිරීක්ෂකයින් / ආරාධිතයින්

2020 දෙසැම්බර් 31 දිනට

සභාපති,
ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුව



**ටී ජේ එස් රාජකාරියර්**
*FCA, FCCA, FCMA, CGMA*

රාජකාරියර් මහතා කේපීඑම්ජී විගණන සමාගමේ හවුල්කරුවෙකු වන අතර පොදු ගිණුම්කරණ පරිචයෙ හි වර්ෂ 35 කට අධික කාලයක් සේවයේ යෙදී සිටියි. ඔහු වර්තමානයේ කේපීඑම්ජී ආයතනයේ විගණන ප්‍රධානියා ලෙස කටයුතු කරයි. කේපීඑම්ජී ආයතනයේ ඔහු මැද පෙරදිග සහ දකුණු ආසියානු කලාපයේ මූල්‍ය සේවා ප්‍රධානියා වූ අතර ශ්‍රී ලංකාව සඳහා කේපීඑම්ජී ආයතනයේ මූල්‍ය අංශ ප්‍රධානියා ලෙස දිගටම කටයුතු කරයි. ඔහුගේ වැඩ නිරාවරණයට ඕමාන්, ඩුබායි, මාලදිවයින් සහ ලන්ඩන් ඇතුලත් වේ. ඔහු 2018 - 2020 කාලයේ දී ACCA ශ්‍රී ලංකා අංශයේ සභාපතිවරයා ලෙස සේවය කලේය.

රාජකාරියර් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුවේ සභාපති වශයෙන් සේවය කරයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කමිටු සහ පීඨ කිහිපියක සේවය කරමින් ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ දී සහ මගපෙන්වීම ලබාදීමේ දී ක්‍රියාකාරීව සහභාගි වී ඇත.

මණ්ඩලයේ නිරීක්ෂක,
භාණ්ඩාගාර නියෝජිත



**කේ එස් දයාරත්න**
*B.Sc. (Bus. Admin), MA, ACA*

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා වන දයාරත්න මිය, රාජ්‍ය අංශයේ වසර 16 කට අධික කාලයක පළපුරුද්දක් ලබා තිබේ. ඇය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පාලක මණ්ඩලයේ සාමාජිකාවක් වේ.

අධ්‍යක්ෂ ජනරාල්



**ඒ අයි මොහොට්ටි**
*FCA, FCMA (UK), CGMA, BBA (Hons.), MBA (Leicester)*

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම) අධ්‍යක්ෂ ජනරාල්වරිය වන මොහොට්ටි මිය නියාමන හා වාණිජ ක්ෂේත්‍රවල නියැලී, මූල්‍ය සහ ව්‍යාපාර කළමනාකරණය සහ විවිධාකාර ව්‍යාපාර අංශවල විගණන කටයුතුවල යෙදීමෙන් වසර 30 කට අධික කාලයක පළපුරුද්දක් ලබා ඇත. එම කාලයෙන් වසර 20 කට අධික කාලයක් ඇය ගිණුම් හා විගණන ප්‍රමිතවලට අනුකූලතාව දැක්වීම සම්බන්ධ නියාමන කටයුතුවල නිරත වී ඇත.

# 2020 තුළ දී මණ්ඩලය පත්කල කමිටු සහ උප-කමිටු

**විගණන කමිටුව**

| | | |
|---|---|---|
| එස් එම් එස් එස් බණ්ඩාර මයා | - | සභාපති (2020 ජුනි 16 දින සිට) |
| මහාචාර්ය ඒ ජයමහ | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| කේ එස් දයාරත්න මිය | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |

**පාරිශ්‍රමික කමිටුව**

| | | |
|---|---|---|
| කේ එම් ඒ එන් දවුලාගල මිය | - | සභාපතිනි (2020 ජුනි 16 දින සිට) |
| පී ඩී සමරසිංහ මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| පී ආර් ඒ අයි ගුණරත්න මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| ආර් ටී අමරසූරිය මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| කේ එස් දයාරත්න මිය | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |

**තාක්ෂණ උප -කමිටුව**

| | | |
|---|---|---|
| ඒ ගුණසේකර මයා | - | සභාපති (2020 ජුනි 16 දින සිට) |
| එච් එම් ඒ ජයසිංහ මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| මහාචාර්ය ඒ ජයමහ | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| පී ඩී සමරසිංහ මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| සී මෙන්ඩිස් මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |

**තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව**

| | | |
|---|---|---|
| පී ආර් ඒ අයි ගුණරත්න මයා | - | සභාපති (2020 ජුනි 16 දින සිට) |
| ඩබ් ඩබ් ජේ සී පෙරේරා මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| ඩී එන් ආර් සිරිවර්ධන මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| කේ කේ එස් ගුණවර්ධන මයා | - | සාමාජික (2020 ජුලි 3 දින සිට) |
| ඒ අයි මොහොට්ටි මිය | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |

**ගැටුම් විසඳීමේ කමිටුව**

| | | |
|---|---|---|
| සී මෙන්ඩිස් මයා | - | සභාපති (2020 ජුනි 16 දින සිට) |
| ආර් ටී අමරසූරිය මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| ඩී එන් ආර් සිරිවර්ධන මයා | - | සාමාජික (2020 ජුනි 16 දින සිට) |
| එච් එම් ඩබ්ලිව් සී බණ්ඩාර මයා | - | සාමාජික (2020 දෙසැම්බර් 15 දින සිට) |
| ඒ ගුණසේකර මයා | - | සාමාජික (2020 දෙසැම්බර් 15 දින සිට) |

# මණ්ඩලයේ වර්තමාන කාර්ය මණ්ඩලය






| | | |
|---|---|---|
| 01. කේ සිවකුමාර් | 06. ඉමල්කා ඉද්දමල්ගොඩ මිය | 11. එච් ශිරෝමි අබේකෝන් මිය |
| 02. ආශා අහමත් මිය | 07. දුමින්දා කේ ගුරුවත්ත මිය | 12. කේ රසික එස් බන්ඩාර |
| 03. අනූෂා අයි මොහොට්ටි මිය | 08. ආර් ඒ නදීශානි මනෝදිකා මිය | 13. දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය |
| 04. මොනිටා එන් බණ්ඩාර මිය | 09. එච් එස් යු පී ජයවර්ධන | 14. කලණි හෙට්ටිආරච්චි මිය |
| 05. හෆ්සා බී රසාක් මිය | 10. ඩී එම් නිලන්ති පී දන්දෙනි මිය | 15. එම් ලක්මාලි හේවගේ මිය |
| | | 16. එල් වත්සලා මල්ලවාරච්චි මිය |

## තාක්ෂණික කාර්ය මණ්ඩලය

**අනූෂා අයි මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), CGMA, BBA (Hons.), MBA (Leicester)*
අධ්‍යක්ෂ ජනරාල්

**ආශා අහමත් මිය**
*FCA, MBA (Col)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**මොනිටා එන් බණ්ඩාර මිය**
*FCA, ACA (E&W), BB Mgt (Acc) Sp*
අධ්‍යක්ෂ තාක්ෂණික

**හෆ්සා බී රසාක් මිය**
*FCA, ACMA (UK), CGMA, MBA (Sri.J)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය**
*FCA, BSc (Acc) Sp (Hons.), MBS (Col)*
අධ්‍යක්ෂ තාක්ෂණික (2021 මාර්තු 01 දින දක්වා)

**එම් ලක්මාලි හේවගේ මිය**
*FCA, ACMA (UK), CGMA, MBA (Sri. J)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**ඉමල්කා ඉද්දමල්ගොඩ මිය**
*ACA, B.Sc (Fin) Sp*
අධ්‍යක්ෂ තාක්ෂණික

**දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**කලණි හෙට්ටිආරච්චි මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**ඩී එම් නිලන්ති පී. දන්දෙනි මිය**
*FCA, BBA (Acc) Sp (Hons.), AIB (SL)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**එල් වත්සලා මල්ලවාරච්චි මිය**
*FCA, B.Sc (Acc) Sp (Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම)1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ස්ථාපිත කරන ලද අතර, එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2000 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. පනත මගින් ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBE - නිර්වචනය සඳහා 63 පිටුව බලන්න.) වශයෙන් නිර්වචනය කර ඇති අතර. එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලතාව දැක්විය යුතුවේ. එසේම ඔවුන්ගේ විගණකවරුන්, මෙම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලතාවය දැක්විය යුතු වේ. එකී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් තම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා විගණනය කිරීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට සමීක්ෂණ කිරීමට හැකිවන පරිදි, විගණනය කරන ලද තම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, එකී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත ඉදිරිපත් කළ යුතු බව පනතින් නියම කර තිබේ.

ලැබුනු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වල විගණන කටයුතු පරීක්ෂා කිරීම, ප්‍රමිතවලට අනුකූලව කටයුතු කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් සහ ඒවායේ විගණකවරුන් විසින් ප්‍රමිතවලට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් උචිත නිවැරදිකිරීමේ ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්‍යයන් වේ. පනත යටතේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත පැනවීම හෝ භාවිතයට ගැනීම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරනු ලබයි. එවැනි ප්‍රමිත භාවිතයට ගැනීමේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ සහයවීමට ගිණුම්කරණ ප්‍රමිත කමිටුවක් සහ විගණන ප්‍රමිත කමිටුවක් පනත යටතේ ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය (IASB) විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත (IAS) සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) පාදක කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංවර්ධනය කර භාවිතයට ගනී. එමෙන්ම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් භාවිතයට ගනු ලබන විගණන ප්‍රමිත, අන්තර්ජාතික විගණන සහ තහවුරු ප්‍රමිත කිරීමේ මණ්ඩලය (IAASB) විසින් සංවර්ධනය කරන ලද අන්තර්ජාතික විගණන ප්‍රමිත මත පාදක කර ඇත. වර්තමානයේ දී, එකී අන්තර්ජාතික ප්‍රමිත හා බැඳුණු, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් අනුකූලතාවය දැක්විය යුතු ගිණුම්කරණ ප්‍රමිත 42 ක් සහ විගණන ප්‍රමිත 38 ක් වරලත් ගණකාධිකාරී ආයතනය විසින් භාවිතයට ගෙන ඇත.

### 2. නියාමන ක්‍රියාකාරකම් කෙරෙහි කෝවිඩ් 19 පාලන පියවරයන්ගේ බලපෑම

සෞඛ්‍ය බලධාරීන් විසින් පනවනු ලැබූ කෝවිඩ් 19 වසංගතය පාලන පියවරයන් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම අවසන් කිරීමේදී සහ විගණන සම්පූර්ණ කිරීමේදී අභියෝග ඇති කර තිබේ. විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට ගෙනවිත් බාරදීමේ දී සහ විගණන කණ්ඩායම් ඉදිරියේ දී විගණන පරීක්ෂණ සිදුකිරීමේ පරිචයට මෙම බලපෑම ඇති වී තිබේ. තවදුරටත්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්‍යය මණ්ඩල, නිවසේ සිට වැඩ කිරීමේ වැඩපිළිවෙල හේතුවෙන්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සම්බන්ධ කර ගැනීම සහ සමහර විගණන ආයතන සහ ඒවායේ කාර්‍යය මණ්ඩල මුහුණ දුන් ප්‍රවේශ සීමා කිරීම් නිසා, දැනට තිබෙන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් භාවිතය උපරිම කරමින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, යොදගත් පරිචයන් වෙනස් කිරීම දක්වා සමාලෝචන යාන්ත්‍රණය යලි සලකා බැලීය. එහි ප්‍රතිඵලයක් ලෙසට, වාර්තා පරිශීලනය කිරීම, ලිපි නිකුත් කිරීම, තාක්ෂණික සාකච්ඡා පවත්වා ගෙනයාම, වාර්තා යාවත්කාලීන කිරීම, විගණන පරීක්ෂණ සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සමග රැස්වීම් පවත්වා ගෙනයාම යනාදියේ දී කටයුතු කාර්‍යය මණ්ඩලය විද්‍යුත් මාධ්‍යයෙන් සමාලෝචනයට එළඹීම තුළින් මෙම නව අවස්ථාවන් උපරිමයෙන් ප්‍රයෝජනයට ගනු ලැබීය.

කෙසේ වුවද, විශාල වෙළුම් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන වලට ප්‍රවේශ වීමේ දී සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන්ගෙන් අමතර තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලියට ඇති එයට ආවේනික වූ සීමාවන් නිසා, මෙම වාර්තාවල "මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ වැදගත් අවස්ථා සහ විගණන පරීක්ෂණ" යන අංග යටතේ විස්තර කර ඇති විවිධාකාර පියවරයන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් භාවිතයට ගෙන තිබේ.

එසේම, සෑමවිටම කාර්‍යය මණ්ඩලයේ සහ පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන ගමන් ම තාක්ෂණික දියුණුවේ උපරිම ඵල ලබා ගනිමින් කාර්‍යය මණ්ඩලයේ ධාරිතා වර්ධන කටයුතු ද අතාත්වික සැසිවාර තුලින් ඉටුකර ගන්නා ලදි.

වර්ෂය තුළ දී තම ව්‍යවස්ථාපිත කාර්‍යයන් ඉෂ්ඨ කිරීමේලා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ප්‍රධාන මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පිළිඹඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

### 3. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

#### 3.1 සමාලෝචනය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න තහවුරු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරගෙනයනු ලැබේ. අනුකූලතාවය නොදැක්වීම සම්බන්ධයෙන් අවශ්‍යකරන පියවර, අනුකූලතාවය නොදැක්වීමේ

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව තීරණය කරනු ලැබේ. හඳුනාගැනීම් සහ මිනුම්කරණය පිළිබඳ මතගැටීම් සහ අනාවරණයන් හා ඉදිරිපත් කිරීම පිළිබඳව මතගැටීම් වලට අදල අනුකූලතාවය නොදැක්වීම සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. ප්‍රමිතවලට ප්‍රමාණාත්මක අනුකූලතාවය නොදැක්වීමට අදාළව සැලකිල්ල දැක්විය යුතු තරම් වූ හේතුවක් නිරීක්ෂණය නොවන අවස්ථාවක දී, එබඳු මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල මූල්‍ය වාර්තා ලෙස සැලකේ. මූල්‍ය ප්‍රකාශනවල, ප්‍රමාණාත්මක වුවත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිතා කිරීමට තරම් ප්‍රමාණාත්මක නොවන මතගැටීමක් හඳුනාගනු ලැබූවිට, අනාගතයේ දී අනුකූලතාවය දැක්වීම වඩා යහපත් කිරීම පිණිස අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත උපකාරක ලිපියක ආකාරයෙන් දැනුම්දෙනු ලබන ඒවා, වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීම් සහිත ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ලෙස සලකනු ලැබේ. ප්‍රමිතවලින් බැහැර වීම්, මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්‍යය සාධනය ප්‍රමාණාත්මක ලෙස වෙනස් කරන්නේ නම්, ඊළඟට නිකුත් කිරීමට නියමිත මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලබන බවට එකඟත්වයක් එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගෙන් ලබාගනු ලැබේ. බැහැර වීම් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන උල්ලංඝනය කරන නමුත් එම උල්ලංඝන බරපතල ස්වභාවයක් නොගන්නේ නම්, මණ්ඩලය විසින් විධානයක් නිකුත් කරනු ලැබේ. කෙසේ වෙතත්, එවැනි බැහැර වීමක් මගින් මූල්‍ය ප්‍රකාශන නොමඟ යවන සුළු බවට පත්කරන්නේ නම්, ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

### 3.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනයේ වැදගත් අවස්ථා

2020 දෙසැම්බර් 31 දින වනවිට, 1995 අංක 15 දරන පනතින් නියමකර ඇති නිර්මාපකය යටතට වැටෙන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සේ හැඳින්වෙන අධීක්ෂණය කළ යුතු අස්ථිත්වයන් 1,657 ක් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය හඳුනාගෙන ඇත. වර්ෂය තුළ දී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 1,194 ක් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,232 ක් ඉදිරිපත් කර තිබුනු අතර, ඒවායින් ඇතැම් මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන වේ.

වර්ෂය තුළ දී, අනිකුත් විගණන නියාමකයින් භාවිතා කරනු ලබන ගෝලීය පරිචයන්ට 2016 වර්ෂයේ දී අනුගත කරන ලද පරීක්ෂණ යාන්ත්‍රණයම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම කරගෙන ගියේය. විගණනයන් හි ඉතා ඉහළ අවදානම් සහිත මූලයන් හඳුනාගැනීමෙන් අරඹෙන එකී ක්‍රමවේදය, ඉතා ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රයන් තුළට ගැඹුරින් පරීක්ෂණය කරගෙන යන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් විගණන ප්‍රමිතවලින් බැහැරවීම් හඳුනා ගැනීමට හැකියාව ලැබේ. එකී ක්‍රමවේදයේ ස්වභාවය සහ පරීක්ෂණවලින් සොයා ගත් දෑ විගණන ආයතනවලට විස්තරාත්මකව වාර්තා කිරීම අනුව, 2016 වර්ෂයට පෙර පැවැති ක්‍රමවේදය හා සැසඳීමේ දී නිත්‍ය පරීක්ෂණ නිම කිරීමට සැලකිය යුතු කාලයක් ගනු ලබන විගණන ගුණාත්මක පරිසරය උසස් කිරීම දෙසට වූ පරිශ්‍රමය තුළින් එකී ක්‍රමවේදය විගණනය කරගෙන යාමට වැඩි කාලයක් ගැනීමත් සමග, කාර්ය මණ්ඩලයට මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා ඇති කාලය සීමා වී ඇත. ගුණාත්මක විගණනය, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පිළිබඳ අවදනම අඩු කරන හෙයින්, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයන් තෝරා ගැනීමේ දී ඉහල අවදනම් සහිත අස්ථිත්වයන් වාර්ෂිකව සමාලෝචනය කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇති අතර, අනෙකුත් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය ආවරණය කිරීම චක්‍රීය පදනමක් මත කරනු ලැබේ.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි සේවයේ යොදවන දක්ෂතා සහිත වරලත් ගණකාධිකාරීවරුන් සඳහා බඳවා ගැනීමේ සහ වැටුප් පාරිශ්‍රමික ගෙවීමේ නිර්මාපකයන්ට අදල ගැටළු විසඳීමට මුදල් අමාත්‍යාංශය අපොහොසත්වීම නිසා අධ්‍යක්‍ෂක තාක්‍ෂණික තනතුරක් සහ සහකාර අධ්‍යක්‍ෂක තාක්‍ෂණික තනතුරු දෙකක් 2019 සිට වර්ෂය පුරාම පුරප්පාඩුව පැවතිනි. එයට අතිරේකව, එක් නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයෙකු වර්ෂයේ මුල් මාස නමය තුළ, 2019 අප්‍රේල් මස සිටම පුරප්පාඩුව පැවති අධ්‍යක්‍ෂක ජනරාල් තනතුරේ වැඩ ආවරණය කිරීම නිසා, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය මෙන්ම විගණන කටයුතු පරීක්‍ෂා කිරීම සඳහා වර්ෂය අවසාන වන විට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට සිටි පරීක්‍ෂණ කාර්ය මණ්ඩලය නවදෙනෙකුට සීමා විය. මෙම කරුණ නිසා, නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයන් දෙදෙනා ද තමන්ට පැවරී ඇති රාජකාරිවලට අමතරව සමීක්‍ෂණ කාර්‍යයවල ද නියුක්ත විය.

ඉහළ අවදානම් සහිත, ආර්ථික වැදගත්කමක් ඇති නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ අනුකූලතා මට්ටම උසස් කිරීමේ අරමුණ ඇතිව ඉහළ අවදානම් සහිත නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කෙරෙහි යොමු වෙමින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වසර ආරම්භ කලේය. කෙසේ වුවද, ඉහත කොටසේ විස්තරකර ඇති කෝවිඩ් 19 පාලන පියවරයන් මගින් සිදු වූ ප්‍රවේශවීමේ දී මුහුණදීමට වූ සීමාවන් හි ප්‍රතිඵලයක් වශයෙන්, පෞද්ගලික අස්ථිත්වයන්ගේ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් විශාල ප්‍රමාණයක් ආවරණය කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම තම සමාලෝචන යොමුව වෙනස් කලේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සම්පූර්ණ කරන ලද විමර්ෂණවලින් 45% ක් නියාමනයන්ට ලක්වූ අස්ථිත්වයන් වූ අතර 55% ක් පෞද්ගලික අස්ථිත්වයන් විය. විමර්ෂණය කල නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ සංයුතියේ කළ මෙම වෙනස් වීම මගින් වසර 3 - 5 කාලපරිච්ඡේදයක් තුළ දී පෞද්ගලික අස්ථිත්වයන්ගේ මූල්‍ය ප්‍රකාශන ආවරණය කිරීමට කර තිබූ සැලැස්ම ක්‍රියාවට යෙදවිය හැකි විය.

වර්ෂය තුළ දී, තාක්‍ෂණික තනතුරු හතරක් පුරප්පාඩුව පැවතිය ද,ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් 694 ක මූල්‍ය ප්‍රකාශන 732 ක සමාලෝචන සම්පූර්ණ කළ අතර, වසර සඳහා සමාලෝචනය කිරීමට සැලසුම් කළ මූල්‍ය ප්‍රකාශන ගණන 725 කි. වර්ෂයේ සම්පූර්ණ කළ සමාලෝචනවලට සාපේක්ෂව 2019 වර්ෂයේ නිශ්චිත ව්‍යාපාරික 699 ක මූල්‍ය ප්‍රකාශන 720 ක සමාලෝචන නිම කරන ලදි.

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

### 3.3 මණ්ඩලයේ කාර්යසාධන සංඛ්‍යාලේඛණ

| | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| **1. හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව** (කාලච්ඡේදයේ අවසාන දිනට) | 1,559 | 1,579 | 1,608 | 1,657 |
| **2. ලැබුණු මූල්‍ය ප්‍රකාශන** | | | | |
| මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (වර්ෂ කිහිපයක් සඳහා ලද මූල්‍ය ප්‍රකාශන ඇතුළුව) | 1,643 | 1,567 | 1,635 | 1,232 |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව | 1,479 | 1,457 | 1,521 | 1,194 |
| **3. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය** | | | | |
| සමාලෝචන සංඛ්‍යාව | 518 | 638 | 720 | 732 |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව | 459 | 608 | 699 | 694 |
| **4. සමාලෝචන වලින් සොයාගත් දෑ** | | | | |
| 4.1 **අනුකූලවීම්** | | | | |
| මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 324 | 430 | 450 | 437 |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව | 306 | 413 | 440 | 421 |
| 4.2 **නිවැරදි කිරීම් සහිතව අනුකූල වීම්** | | | | |
| මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 185 | 202 | 267 | 293 |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව | 150 | 193 | 256 | 274 |
| 4.3 **අනුකූල නොවීම්** (ඒකඟතාවයන්, විධානයන්, අනතුරු ඇඟවීම්) | | | | |
| මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 9 | 6 | 3 | 2 |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව | 9 | 6 | 3 | 2 |
| **5. මූල්‍ය ප්‍රකාශන වලින් සොයා ගැනීම් සමාලෝචනය කල මූල්‍ය ප්‍රකාශන වල % ලෙස** | | | | |
| අනුකූලවීම් | 62% | 67% | 62% | 59% |
| වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීම් සහිතව අනුකූල වීම් | 36% | 32% | 37% | 40% |
| අනුකූල නොවීම් (ඒකඟතාවයන්, විධානයන්, අනතුරු ඇඟවීම්) | 2% | 1% | 1% | 1% |

සමාලෝචනය කල මූල්‍ය ප්‍රකාශන වලින් 1% ක් අනුකූල නොවූ බව 2020 වර්ෂය තුළදී සමාලෝචන වලින් වූ සොයා ගැනීම් වලින් අනාවරණය විය. සමාලෝචනය කල මූල්‍ය ප්‍රකාශන වලින් 59% ක් අනුකූල වූ බවත් මූල්‍ය ප්‍රකාශන වලින් 40% ක් උපකාරක ලිපි මාර්ගයෙන් සන්නිවේදනය කරනු ලැබූ වැඩිදියුණු කිරීම් සහිතව අනුකූල වීම් බවත් එයින් දැක්විණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අදාල අවශ්‍යතාවයන් ගෙන් සැළකිය යුතු ලෙස බැහැරවීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සැළකිය යුතු ලෙස වෙනස්වීම් ලැයිස්තුගත අස්ථිත්වයන් වූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකක මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනුණි. ඒ අනුව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් ලබා ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාවන් සඳහාවූ ඒකඟතාවයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීම් වලට නිවැරදි කිරීම් සිදු කරන ලදි.

ප්‍රමාණවත් වන නමුත් ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කරමින් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් නොවූ හඳුනාගනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලට, තමන්ටම අවශ්‍ය පරිදි, අනුකූලවීම වැඩි දියුණු කරගැනීමට හැකිවනු පිණිස, පුළුල් විමසීම් වලින් තොරව, වැඩිදියුණු කිරීම් ලෙස, ලිපි මාර්ගයෙන් දැනුම්දෙන ලදි. වර්ෂය තුළ දී, මූල්‍ය ප්‍රකාශන කට්ටල 293 ක් වෙනුවෙන් මෙසේ වැඩි දියුණු කිරීමේ ලිපි නිකුත් කරන ලදී.

(2020 වර්ෂය තුළදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය මත කරනු ලැබූ නිරීක්ෂණ සඳහා 20 වන පිටුව සහ ලබාගත් ඒකඟතාවයන් සඳහා 22 වන පිටුව බලන්න).

### 4. විගණන පරීක්ෂණ

වර්ෂය තුළ දී, ඊට පූර්ව වර්ෂයේ දී

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

ආයතන 7 ක් විසින් කරගෙන යන ලද විගණන 33 ක් හා සංසන්දනාත්මකව වෘත්තියේ නියුක්ත වරලත් ගණකාධිකාරී ආයතන 7 ක් විසින් කරගෙන යන ලද විගණන 27 ක් පරීක්ෂා කරනු ලැබීය.

සමාලෝචන කටයුතුවල නියැලි තනතුරු තුනක්, වර්ෂය තුළදී කරන ලද අභ්‍යන්තර උසස් කිරීම සහ පෙර වසරේ දී ඉල්ලා අස්වීම් වල සෘජු ප්‍රතිඵලයක් ලෙස, පරීක්ෂණවල නියැලෙන තාක්ෂණික කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව අඩුවීම නිසා, වර්ෂය තුළදී කරන ලද විගණන පරීක්ෂණ සංඛ්‍යාව 2020 වර්ෂයට වඩා අඩුවිය. කෝවිඩ් 19 වසංගතයේ පළමු රැල්ල හේතුවෙන් විගණන පරීක්ෂණ අගෝස්තු 1 දයින් පසු කාලපරිච්ඡේදයන්ට විලම්බනය කිරීම ද මෙම අඩුවීමට දයකවිය.

කෙසේ වුවද, වසංගතයේ දෙවන රැල්ල තුළ දී, මයික්‍රොසොෆ්ට් ටීම්ස් තුළින් නිත්‍ය විගණන පරීක්ෂණ, දුරස්තව කරගෙනයාම මුලපිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සමත්විය.

තවදුරටත්, තේමාමය විගණන පරීක්ෂණ කරගෙනයාමට සෘජු සබඳතා පවත්වා ගැනීමේ දී, සමාජ දුරස්ථභාවය සහ ප්‍රවේශ සීමා අවශ්‍යතා වලින් සෘජු බලපෑමක් ඇති නිසා, 2020 වර්ෂය තුළදී තේමාමය විගණන පරීක්ෂණ කරගෙනයාමේ සැලැස්ම නැවත ඇගයීම් කරන ලදි. එමගින්, විගණනයට ලක්වූ අස්ථිත්වයන් ගේ මෙහෙයුම් කෙරෙහි කෝවිඩ් 19 යේ බලපෑම සලකා බැලීමේ දී, විගණනකවරුන් විසින් කරගෙනයනු ලබන විගණන ක්‍රියාපටිපාටි වල යෝග්‍යතාවය සමාලෝචනය කිරීමට අතිරේක කාලය වෙන් කිරීමටවූ අවශ්‍යතාව තුළින් පරීක්ෂණ නිත්‍ය විගණන පරීක්ෂණ වලට සීමා කළේය.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 තුළදී කරගෙනගිය තේමාමය විගණන පරීක්ෂණ 12 හා සංසන්දනාත්මකව වර්ෂය තුළදී තේමාමය විගණන පරීක්ෂණ කරගෙනයනු නොලැබීය. කෙසේ වුවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම 2018 තුළදී කරගෙන ගිය තේමාමය විගණන පරීක්ෂණ වලින් වූ සොයා ගැනීම් සහිත වාර්තාව වර්ෂය තුළ ප්‍රසිද්ධ කරන ලදි.

වර්ෂය තුළදී පරීක්ෂාවට ලක්කරන ලද විගණන ලිපිගොනු අවදානම්-පාදක ප්‍රවේශය මත තෝරාගන්නා ලදී. කෙසේ වුවද, පරීක්ෂණය සඳහා විගණන තෝරාගැනීමට වඩාත්ම ඵලදයී අවදානම්-පාදක තෝරාගැනීමේ විලඹුමක් සංවර්ධනය කරන ලද අතර එය දැනට ප්‍රගතිය ලබමින් පවතී.

වර්ෂය තුළදී නිත්‍ය පරීක්ෂණවල ප්‍රතිඵලය වූයේ 2019 තුළදී විගණන ආයතන 6 ක් විසින් සිදුකරන ලද විගණන 15 හා සංසන්දනාත්මකව විගණන ආයතන 3 ක් විසින් සිදුකරන ලද විගණන 3 ක් තුළ ඌනතා නිරීක්ෂණය වීමයි. වැදගත්වූ කරුණු අදල විගණන ආයතන වෙත සන්නිවේදනය කරනු ලැබීය. (විගණන පරීක්ෂණ වලින් සොයා ගැනීම් සඳහා 23 වන පිටුව බලන්න).

## 5. විමර්ශන

### 5.1 ඇඩම් කැපිටල් පොදු සමාගම

2014 සහ 2015 මාර්තු 31 දායින් අවසන්වූ වර්ෂ සඳහා ඇඩම් කැපිටල් පොදු සමාගමේ පූර්වගාමී විගණකවරයා විසින් සමාගමේ ගිණුම් පොත්පත් සහ අදාළ ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට අපොහොසත් වීම සම්බන්ධයෙන් විගණන මතය වියාචනය කිරීමෙන් පසු 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා, වර්තමාන විගණකවරයා විසින් තත්ත්වාගණනය නොකල විගණන මතයක් නිකුත් කර ඇත.

පසුව, එම මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස මණ්ඩලය සමාගමට විධානයක් නිකුත් කල අතර නැවත විගණනය සඳහා වන අතිරේක පිරිවැය දැරීමට සමාගම අකමැත්තෙන් පසුවිය. පසුව, 2017 මාර්තු 31 දයින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන පරීක්ෂණයේ දී ද එකී විගණකවරයා විගණන ප්‍රමිත උල්ලංඝණය කිරීම දිගටම කරගෙන යන බව ද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් පෙර දී ගෙනහැර දැක්වූ කරුණු කෙරෙහි යොමුවී නැති බවද සොයාගන්නා ලදි. විගණකවරයාට එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් උපදෙස් ලබාගැනීමෙන් පසු, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අවශ්‍යකරන සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලියේ නියුක්තව සිටී.

### 5.2 සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කොම්පැණි පොදු සමාගම

සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කොම්පැණි පොදු සමාගම 2019 මාර්තු 31 දයින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල සමහර කරුණු සම්භන්ධයෙන් අදල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා අනුකූලතාව දැක්වීමට අපොහොසත් වී ඇත. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් එවැනි අනුකූලතාව නොදැක්වීම් පුන පුනා සංනිවේදනය කලද, වසර ගණනාවක් පුරා එවැනි අනුකූලතාව නොදැක්වීම් නිදෙස් කිරීමට සමාගම අපොහොසත් වී ඇත. විමර්ෂණයට අනතුරුව, සමාගමට සහ සමාගමේ විගණකවරයාට එරෙහිව ගතයුතු ඊලඟ ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා ඇත. දැනට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අනුගමනය කලයුතු ක්‍රියා පටිපාටි පිළිබඳ තවදුරටත් නීතිපතිවරයාගෙන් උපදෙස් ලබාගැනීමේ ක්‍රියාවලියේ නියුක්තව සිටියි.

## 6. පොදු ව්‍යාපාර ව්‍යවසායන් පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශයන් පිළිබඳ කාර්යසාධනය

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම 2014 සහ 2015 යන වර්ෂවල සියළුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්හී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කරමින් පොදු ව්‍යාපාර ව්‍යවසාය කමිටුවට (කෝප් කමිටුවට) ලබාදුන් එකඟත්වය ඉටු කිරීමෙන් පසු, සොයා ගන්නා අනුකූලතාවය නොදැක්වීම්වල ගුණාත්මකභාවය උසස් කිරීම සම්බන්ධයෙන් උචිත ක්‍රමවේදයක් වශයෙන් සමාලෝචනය සඳහා, මූල්‍ය

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

ප්‍රකාශන, අවදානම් පාදක ක්‍රමයක් මත තෝරා ගැනීම කෙරෙහි යොමු විය. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සියලුම නියාමනයට යටත්වන අස්ථිත්වයන් වාර්ෂිකව ද ඉහළ අවදානම් සහිත පෞද්ගලික අස්ථිත්වයන් සෑම වසර 3 කදී සහ අඩු අවදානම් සහිත පෞද්ගලික අස්ථිත්වයන් වර්ෂ 5 ක් තුළදී වන පරිදි ඇතුලත් සියලුම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් වර්ෂ 3-5 දක්වා වූ කාලපරාසයක් තුළදී සමාලෝචනය කිරීමට සලකා බලයි. ප්‍රමිතයන් සහ කේත, ගිණුම්කරණය සහ විගණනය පිළිබඳව නිරීක්ෂණ වාර්තාවේ 2015 (ROSC) ලෝක බැංකුව විසින් ද ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් ද ඉහළ අවදානම් සහිත අස්ථිත්වයන් කෙරෙහි විසතරාත්මක අවධානය යොමු කිරීමට පක්ෂව කරුණු දක්වා ඇත. තවද, 2016 වර්ෂයේ සේවක මණ්ඩලයේ ධාරිතා වර්ධන කටයුතුවල නියැලී සිටි අන්තර්ජාතික උපදේශකවරුන් විසින්ද මෙම ක්‍රමවේදය ගෝලීය වශයෙන් භාවිතා කරන ක්‍රමවේදයක් වශයෙන් හඳුනා ගෙන ඇත.

2020 වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණ වලින් සොයාගත් දෑ තුළින් එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේදී අවදානම් පාදක පරීක්ෂාව තෝරාගැනීම මඟින් සංකලනිත මූල්‍ය ප්‍රකාශන හා විගණන පරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇති බව පෙන්නුම් කරයි. එවැනි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනයන් කරගෙනයාම, එවැනි මූල්‍ය ප්‍රකාශන විගණනයේදී විශේෂිත අංශයන් පරීක්ෂා කිරීමට යොමුවීම කඩිනම් කරවන අතර එමගින් විගණනයන්හි අනුකූල නොවීම් වඩාත් පහසුවෙන් හඳුනාගැනීමට හැකියාවක් ලැබේ.

## 7. ප්‍රමිත ස්ථාපිත කරන්නාට සහයෝගය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිත කමිටුව ගිණුම්කරණ හා විගණන ප්‍රමිති භාවිතයට ගැනීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කර සහයෝගය දක්වයි.

2020 වර්ෂය තුලදී, ඉහත සඳහන් කමිටු දෙක මගින් කරගෙනයන ලද කටයුතු අතරට ඇතලත් වූයේ

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 2020 සංග්‍රහය නිකුත් කිරීම
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති කිහිපයකට සංශෝධන නිකුත් කිරීම
- කෝවිඩ් 19 සම්බන්ධ සලකා බැලිය යුතු ගිණුම්කරණ සහ විගණන කරුණු පිලිබඳ මගපෙන්වීම නිකුත් කිරීම
- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 17 "රක්ෂණ ගිවිසුම්" බලපැවැත්වෙන දිනය 2023 ජනවාරි 1 ලෙස භාවිතයට ගැනීම
- ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ පිලිබඳ අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීමට සංස්කරණිත විගණන ප්‍රමිතිය නිකුත් කිරීම
- 2021 දී බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සංශෝධනය කොට එම ප්‍රකාශනයන් සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම ඇතුළුව ගැසට් පත්‍රයේ පල කිරීම
- නිරාවරණ කෙටුම්පත් සහ සාකච්ඡාමය පත්‍රිකා සඳහා ප්‍රතිචාර දැක්වීම
- අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය සහ අන්තර්ජාතික විගණන සහ සහතිකවීමේ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් (IFRSs) සහ සංශෝධන විචාරාත්මකව සාකච්ඡා කිරීම සහ
- නව හෝ සංශෝධිත ප්‍රමිති පිළිඹඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කරගෙනයාම

ප්‍රමිති පැනවීම සහ ඒ අනුව රටේ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පැනවීම මගින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය නිත්‍ය දයකවීම හඳුනාගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ප්‍රමිති පැනවීමේ කටයුතු සඳහා සහයවීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මගින් වාර්ෂික ප්‍රදානයක් ප්‍රතිපාදනය කිරීමට මුදල් අමාත්‍යාංශය අතීතයේ වැඩපිලිවෙලක් සකසා තිබුණි. අතීත වැඩපිලිවෙල අඛණ්ඩව කරගෙනයාම වෙනුවෙන්, කමිටු දෙකේ සහ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති භාවිතයට ගැනීමේ පිරිවැයෙන් කොටසක් මූල්‍යනය කිරීමට රුපියල් මිලියන 4 ක මුදලක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට වර්ෂය තුලදී ගෙවන ලදි. (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ප්‍රමිති පැනවීම සම්බන්ධයෙන් 2020 වර්ෂය තුලදී කරගෙන යන ලද කටයුතු සඳහා 43 වන පිටුව බලන්න).

## 8. ජාත්‍යන්තර සබඳතා

මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ ප්‍රමිතවලට අනුකූලවීම් සමාලොචනයට අදල කරුණු පිළිබඳ ලෝකය පුරා සිදුවන වර්ධනයන් සමඟ යාවත්කාලීන දැනුමෙන් යුතුවීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම බොහෝ ජාත්‍යන්තර සංවිධානයන්හි සාමාජිකත්වය ලබාගෙන ඇත. අනෙකුත් නියාමකයන්ගේ තොරතුරු සහ සහාය ලබාගැනීමට සහ ඒකාබද්ධ ක්‍රියාකාරකම් වශයෙන් බොහෝ නියාමකයින්ට ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම් කරගෙනයාමට මෙම ආශ්‍රිතත්වය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට කවුළුවක් විවෘතකර ඇත.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම පහත සඳහන් ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්ව පවත්වා ගෙන යයි.

අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - 2007 වර්ෂයේදී පැවැත්වූ පළමු පූර්ණ රැස්වීමේ සිට සාමාජිකයෙකි.

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

ආ) ජාත්‍යන්තර විගණන හා තහවුරුකිරීම් ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශාත්මක නිර්දේශ කිරීමේ කණ්ඩායම - 2007 වර්ෂයේ දී සාමාජිකයෙකු වශයෙන් පත්කරගන්නා ලදී.

ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාරධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශාත්මක නිර්දේශ කිරීමේ කණ්ඩායම - 2009 වර්ෂයේදී සාමාජිකයෙකු වශයෙන් පත්කර ගන්නා ලදී.

ඊට අතිරේකව, ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය එක්සත් ජාතීන් විසින් වාර්ෂිකව පවත්වන ජාත්‍යන්තර ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිති (ISAR) පිළිබඳ අන්තර්රාජ්‍ය ප්‍රවීණයන්ගේ කණ්ඩායම් සැසිවාරයන් හිදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

ලොව පුරා අත්දකින්නට ලැබුණු කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්, සියලු ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ ශාරීරික හමුවීම් ආකාරයෙන් පැවැත් වීම අත්හිටවන ලදී. කෙසේ වුවද, මෙම තත්වය අතරමැද, සමහර ජාත්‍යන්තර සංවිධාන සැලසුම් කරන ලද රැස්වීම් කල්දමා පසුව එවැනි රැස්වීම් අතාත්වික රැස්වීම් ලෙස පවත්වන ලදී.

වර්ෂය තුළ දී, කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් එක් අයෙක් අතාත්වික ලෙස පවත්වන ලද උපදේශාත්මක නිර්දේශ කිරීමේ කණ්ඩායම් දෙකක රැස්වීම් වලට සහභාගි වූ අතර, සාමාන්‍ය තත්වයන් යටතේ IFIAR පූර්ණ රැස්වීමේ න්‍යාය පත්‍රයේ අයිතමයක් වන, ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) විසින් ගෝලීය ප්‍රසිද්ධ ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් වන විගණන ආයතන සමග කැඳවන ලද සීමිත සැසිවාර වලට කාර්යමණ්ඩලයේ සාමාජිකයින් එක් අයෙක් සහභාගි විය .

කෙසේ වෙතත්, 2020 වර්ෂයේ පළමු මාස තුන තුළ දී රජය මගින් විදේශ ගමන් සීමා කිරීම නිසා, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට, ප්‍රථම වතාවට, 2020 පෙබරවාරි මාසයේ පැවැත්වූ IFIAR පරීක්ෂණ වැඩමුළුවට සහභාගි වීමට නොහැකි විය. ලොව පුරා ස්වාධීන විගණන නියාමකයින් සහභාගිවන IFIAR විසින් පවත්වන පරීක්ෂණ වැඩමුළු ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට තොරතුරු සපයාගෙන දැනුම බෙදාගැනීමේ වේදිකාවක් වේ.

අතීතයේ දී, විගණන නියාමනයට සම්බන්ධ රැස්වීම් සහ පරීක්ෂණ වැඩමුළු සහ සම්මන්ත්‍රණ වලට සහභාගි වීම තුළින් ලොව පුරා සමගාමී විගණන නියාමකයින් සමග සාකච්ඡා සහ ජාලගත කිරීම් වලට එළඹීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට හැකියාව ලැබී තිබුණි. එම නිසා මෙම ගෝලීය සැසිවාරයන්හි සහභාගිත්වය මගින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට තම ධාරිතා ගොඩනගා ගැනීමට හැකි විය. මෙම සබඳතා තුළින් ගෝලීය ව්‍යවහාරයන් ගැන දැනුවත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ගේ නියාමන යාන්ත්‍රණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් රටේ නියාමන පරිසරය ශක්තිමත් කිරීමට ද හැකි විය.

## 9. මානව සම්පත්

### 9.1 කාර්ය මණ්ඩලය

2020 දෙසැම්බර් 31 දිනය වන විට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය දහ අට දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් එකොලොස් දෙනෙක් වරලත් ගණකාධිකාරීවරු වූහ. සමස්ත තාක්ෂණ කාර්යමණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් පස් දෙනෙක් සහ සහකාර අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත විය. තාක්ෂණික කාර්ය මණ්ඩලයෙන් තුන් දෙනෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති අතර, අට දෙනෙක් ස්ථිර පදනම මත සේවා නියුක්තව සිටී.වර්ෂය තුළ දී, නිසි ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් පසුව, 2019 අප්‍රේල් සිට පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂක ජනරාල් තනතුරට වැඩබලන අධ්‍යක්ෂක ජනරාල් උසස් කරන ලදී. කෙසේ වෙතත්, 2019 ජනවාරි සිට පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂක තාක්ෂනික තනතුර සහ 2019 අවසානයේ සිට පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂක තනතුරු දෙක, 2020 වර්ෂය පුරාත් පුරප්පාඩුව පැවතිනි. අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව අදාල වැටුප් පරිමාණ රඳා පවතින බැවින් හොඳ පළපුරුද්දක් ඇති, තාක්ෂණික නිපුනතාවය සහිත වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වීම නිසා මේ තත්වය උදා විය. සහකාර අධ්‍යක්ෂක (මූල්‍ය සහ පරිපාලන) තනතුර වර්ෂය තුළ දී පිරවීමත් සමග, වර්ෂය අවසානයේදී වර්තමානයේ අනුමත පිරිස් සංඛ්‍යාවේ විධායක ශ්‍රේණියේ පුරප්පාඩු 5 ක් පැවතිනි. මීට අමතරව 2018 අනුමත කරන ලද නව පිරිස් සංඛ්‍යාවේ පිරවියයුතු විධායක ශ්‍රේණියේ තනතුරු 8 ක් ද තිබේ.

සමාලෝචන කාර්යයන්හි නියුතු තාක්ෂණික කාර්යය මණ්ඩලයේ හිගකම නිසා වර්ෂය තුළ දී අපේක්ෂිත මූල්‍ය වාර්තා සමාලෝචන සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාව නිම කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට නොහැකි විය. එයට අතුරු පියවරක් ලෙස, මූල්‍ය වාර්තාවල ප්‍රාථමික සමාලෝචන කාර්යය කරගෙනයාම සඳහා බඳවා ගෙන තිබූ බාහිර සමාලෝචකයිනගේ සේවය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අඛන්ඩව ලබා ගත්තේය.

කෙසේ වෙතත්, තාක්ෂණික කාර්යය මණ්ඩලයේ හිගකම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ප්‍රගතියට ඇති මූලික සීමාකාරී බාධකය ලෙස සලකනු ලබන අතර මෙම ගැටලුව විසඳීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හැකිතාක් දුරට සෑම උත්සාහයක්ම ගෙන ඇත. මෙසේ කිරීමේදී, මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග කාර්යය මණ්ඩලයට සම්බන්ධ එකී ගැටලුව සාකච්ඡා කල අතර නියාමන කාර්යය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශයෙන් වාසිදයක විඳුමක් බලාපොරොත්තුවෙන් සිටියි.

### 9.2 බාහිර සමාලෝචන මණ්ඩලය

2012 වර්ෂයේදී පොදු ව්‍යාපාර ව්‍යවසායන් පිළිබඳ කමිටුව (COPE)

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

විසින් නිකුත් කරන ලද නිර්දේශවලට අනුකූලවීමට ගනු ලැබූ පියවරයන් ලෙස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම තම කාර්යමණ්ඩලය විසින් සමාලෝචනයට භාජනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව වැඩි කිරීමට දරනු ලබන ප්‍රයත්නයේදී මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සඳහා බඳවාගත් බාහිර සමාලෝචකයින් සේවයේ යොදා ගැනීම අඛණ්ඩව කරගෙන ගියේය. වර්ෂය තුළ දී, කාර්යාල පරිශ්‍රයට පිවිසීමේ සීමා සහ සමාජ දුරස්ථභාවය සඳහා වූ අවශ්‍යතාවය නිසා, බාහිර සමාලෝචන මණ්ඩලයට අළුතින් සමාලෝචකයින් කිසිවෙකු බඳවා නොගත් අතර බාහිර සමාලෝචකයින් විසින් කරනු ලබන සමාලෝචනයන්හි ගුණාත්මක භාවය පිළිබඳ කලින් කලට කරගෙන යන ඇගයීම් මත පදනම්ව, පෙර බඳවා ගත් සමාලෝචකයන් දෙදෙනෙකුගේ සේවය අවසන් කෙරිණි. ඒ අනුව, වර්ෂය අවසානය වනවිට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ බාහිර සමාලෝචකයින් 15 දෙනෙක් සේවය කරන ලදි.

කාලච්ඡේද පදනමක් මත කරගෙන යන සමාලෝචකයින්ගේ වැඩවල ගුණාත්මකභාවය පිළිබඳ ඇගයීම බාහිර සමාලෝචකයින් විසින් කරනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය උසස් කිරීමට හේතුවේ. එමගින් සමාලෝචකයින්ගේ වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමටත්, සංනිවේදනය කිරීමටත් හැකියාව ඇති වේ.

වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද මූල්‍ය වාර්තා සමාලෝචන වලට බාහිර සමාලෝචකයින් විසින් ප්‍රාථමික සමාලෝචනය සම්පූර්ණ කරන ලද මූල්‍ය වාර්තා කට්ටල 115 ක් ඇතුලත් විය. වර්ෂය තුළ දී, බාහිර සමාලෝචකයින් මූල්‍ය වාර්තා කට්ටල 90 ක ප්‍රාථමික සමාලෝචන කර තිබූ අතර ඔවුන්ගේ සේවා සඳහා රුපියල් මිලියන 1.35 ක මුදලක් ගෙවනු ලැබීය. එකී සමාලෝචනයන් අවසන් කිරීමේදී, සොයාගත් කරුණු මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මයේ තාක්ෂණ කාර්ය මණ්ඩලයට අතිරේක තොරතුරු ලබාගැනීමට, නිවැරදි කිරීම සඳහා එකඟතාවයන් ලබාගැනීමට සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීමට සහ ව්‍යවස්ථාපිත නිවැරදි කිරීමේ පියවරයන් ගැනීමට සිදුවිය. තවද, වසර තුළ සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයන් අතුරින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 617 ක ප්‍රාථමික සමාලෝචන කටයුතුත් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී.

## 10. ආයතනික යහ පාලනය

ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සාමාජික මණ්ඩලයක් මගින් පාලනය වේ. ඒ අනුව, නිලබලයෙන් පත්කරන ලද සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සහ හඳුනාගන්නා ලද ආයතනවලින් ලද නාමයෝජනා අතරින් මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිලබලයෙන් පත්වන සාමාජිකයන් වන්නේය. පත්කළ සාමාජිකයන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3 දෙනෙක්), එක්සත් රාජධානියේ වරලත් කළමනාකාර ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා අංශය, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා කර්මාන්ත සහ වානිජ මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම්කරනු ලබන තැනැත්තන්ය. සාමාජිකයෙකුගේ නිලකාලය වර්ෂ හතරකි.

2019 නොවැම්බර් මාසයේ දී, ජනාධිපතිවරණය සමාප්තියෙන් අනතුරුව, වහාම ක්‍රියාත්මක වන පරිදි සියළුම මණ්ඩල විසුරුවන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය ඉල්ලා සිටියේය. අනතුරුව, 2020 මුල්කාලයේ සිට, නව සාමාජිකයන් පත්කෙරෙනු අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිනි, කේ එම් ඒ එන් දවුලාගල මිය මණ්ඩලයේ සභාපතිනිය ලෙස පත්කිරීමත් සමග මණ්ඩලයේ පලමු රැස්වීම 2020 මාර්තු 13 වෙනි දින පැවැත්විණි.

2020 දී කරන ලද නව පත්වීම් සමග, 2019 වර්ෂය තුළ දී පුරප්පාඩුව පැවැති නම්කරනු නොලැබූ පුරප්පාඩු දෙක හා සමග සසඳන විට 2020 දී පනත අනුව මණ්ඩලයේ සංයුතිය සම්පූර්ණ විය.

වර්ෂය තුළ දී, පනත අනුව පත්කරන ලද මණ්ඩලයේ සාමාජිකයන්වූ ඒ ගුණසේකර, පී ආර් ඒ අයි ගුනරත්න සහ පී ඩී සමරසිංහ යන මහත්වරුන් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හි අධ්‍යක්ෂවරුන් හෝ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ලෙස සේවය කරන ලදි. එමෙන්ම, මණ්ඩලයේ සාමාජිකයන්වූ එච් එම් ඒ ජයසිංහ සහ ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරනු ලබන පරිචයෙහි නියුතු  ගණකාධිකාරී ආයතනවල හවුල්කරුවන් වශයෙන් කටයුතු කළ අතර මණ්ඩලයේ සාමාජිකයෙක් වූ එස් එම් එස් එස් බණ්ඩාර මහතා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයක අධ්‍යක්ෂවරයෙකු සහ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරනු ලබන පරිචයෙහි නියුතු ගණකාධිකාරී ආයතනයක හවුල්කරුවකු ලෙස ද සේවය කලේය.

තවද, වසර තුළ මණ්ඩලයේ ආරාධිතයෙකු වූ ටී ජේ එස් රාජකාරියර් මහතා ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරනු ලබන පරිචයෙහි නියුතු ගණකාධිකාරී ආයතනයක හවුල්කරුවකු ලෙස සේවය කලේය.

මණ්ඩලයේ ස්වාධීනත්වය සහතිකවීම පිණිස, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හෝ එහි විගණනයට අදාළ සියළු ලිපි ලේඛන/ පත්‍රිකා අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හෝ ඒවායේ විගණකවරුන් සමග සබඳතා ඇති සාමාජිකයින් වෙත යවන ලේඛන/ පත්‍රිකාවලින් ඉවත් කෙරේ. එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ට අදාළ කරුණු ඇතුළත් සාකච්ඡා සඳහා එවැනි සාමාජිකයෝ සහභාගී නොවේ.
මණ්ඩලයේ පලමු රැස්වීමෙන් පසු

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

අඛණ්ඩව දීර්ඝ ඇඳිරිනීතිය පැවතිය ද, පලමු රැස්වීම් තුන අතාත්වික රැස්වීම් ලෙස ද, ඊට පසුව, නව සාමාන්‍ය තත්වයට පත්වීමත් සමග, ශාරීරිකව හමුවන රැස්වීම් ලෙස ද සුදුසු පරිදි රැස්වීම් කැඳවීම මණ්ඩලය අඛණ්ඩව කරගෙන ගියේය. කෙසේවුවද, කෝවිඩ් 19 දෙවන රැල්ල ආරම්භයත් සමඟ 2020 ඔක්තෝබරයේ සිට රැස්වීම් අතාත්වික රැස්වීම් ලෙස අඛණ්ඩව කරගෙන යන ලදි. ඒ අනුව වර්ෂය තුළ දී මණ්ඩලය රැස්වීම් 9 ක් පවත්වා ඇත.

වර්ෂය තුළ දී මණ්ඩලය විසින් සැලකිලිමත්ව පැවැත්වූ සාකච්ඡාවන් අතර සමස්ථ මෙහෙයුම් දර්ශකයන්ට අනුව කාර්යය මණ්ඩලය ඉටු කළ කාර්යය සාධනය සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් හා සම්බන්ධ වැදගත් තාක්ෂණික ගැටළු විසදීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග පිළිබඳ ආවරණය කරන ලදි. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් සිදුකරන ලද ප්‍රමිත වලට අනුකූල නොවීමේ අවස්ථාවන්ට අදාල ගැටලු පිළිබඳවද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය ලේඛනය සහ ක්‍රියාකාරී සැළසුම අනුමත කිරීම කෙරෙහිද මණ්ඩලය යොමු විය. පවත්නා උග්‍ර කාර්ය මණ්ඩල හිඟය හමුවේ සමාලෝචන යාන්ත්‍රනයන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායිකත්වය උසස්කිරීමට ඇති විවිධ ප්‍රවේශයන් සමාලෝචනය කිරීමෙහිද මණ්ඩලය නියුක්තව සිටියහ. තවදුරටත්, 2019 අප්‍රේල් මස සිට පුරප්පාඩුව පැවැති අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරට නිසි ක්‍රියාපටිපාටිවලට අනුගත වෙමින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ හතර වන අධ්‍යක්‍ෂ ජනරාල්වරයා පත් කිරීමේ කාර්යයෙහි ද මණ්ඩලය නියුක්තව සිටියහ. ඊට අමතරව, තාක්ෂණික ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකිවීමේ ගැටළුව විසඳීම සඳහා සාමූහික ප්‍රයත්නයක් දැරීය. එම ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස, තාක්ෂණික නිපුණතාව සහිත කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකිවීම හා ඒ අනුව අපේක්ෂිත මට්ටමට නියාමන කාර්යයන් කාර්යයසාධනයට බාධාවීම පිළිඹඳව භාණ්ඩාගාර ලේකම්වරයා සමග රැස්වීමක් පැවැත්වීය. මේ උදෙසා කාර්යමණ්ඩල පාරිශ්‍රමික පිළිවෙත සංශෝධනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි විවිධ ප්‍රවේශයන් සමාලෝචනය කිරීමේ කාර්යයයෙහි ද මණ්ඩලය නිරත විය. භාණ්ඩාගාර ලේකම්වරයාගේ යෝජනාව පරිදි කාර්යමණ්ඩල ගැටළුව විසඳීමට යෝජනාවලියක් මණ්ඩලය ඉදිරිපත්කල අතර එම ගැටළුවට ස්ථිර විසඳුමක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

මණ්ඩලයේ අධිකාරී බලය පැවරීමේ ප්‍රතිපත්තිය අනුව, අවශ්‍ය තොරතුරු රැස්කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, විගණන පරීක්‍ෂණ, විමර්ෂණ පැවැත්වීම වැනි ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම අධීක්‍ෂණයට අදාල නිත්‍ය මෙහෙයුම් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් අධීක්ෂණය කරන ලද සහ මඟපෙන්වන ලැබූ කාර්යමණ්ඩලය විසින් වර්ෂය තුළ කරගෙනයන ලදී.

## 11. මූල්‍ය කාර්යසාධනය

වර්ෂය තුළදී. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය රජය විසින් සැපයූ අරමුදල් වලින් විය. රජය විසින් සපයන ලද අරමුදල් මගින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කටයුතු මූල්‍යනය කරනු ලැබුවද, විකල්පයක් ලෙස, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි කොටස් හිමියන්ගේ ස්කන්ධය හෝ බදු ගෙවීමෙන් පසු ලාභය යන ද්විත්වයෙන් වැඩි අගය මත පදනම්ව පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක සෙස් බද්දක්, මණ්ඩලයේ වියදම් පියවා ගැනීමට අය කළ හැකිය. කෙසේ වුවද, මෙම විකල්පය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වැඩි කැමැත්තක් නොදැක්වූ අතර 2008 ජනවාරි 01 දින හෝ ඊට පසුව ක්‍රියාත්මක කිරීමට යෝජනාකර තිබූ සෙස් බද්ද 2008 ඔක්තෝබර් 07 දින ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලා අස්කරගන්නා ලදී.

නිවසේ සිට වැඩ කිරීම ආකාරයෙන් ඇතිවූ දුරස්ථව වැඩ කිරීමේ සහ සේවා මුර පදනම්ව කාර්‍යාලයට පැමිණීමේ වැඩ පිලිවෙලවල් වල සෘජු ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මයේ මෙහෙයුම් වියදම් රුපියල් 65,159,150/- ක් වූ අතර ඊට අනුරූප පූර්ව වර්ෂයේ වියදම රුපියල් 78,511,881/- ක් විය. මෙහෙයුම් වියදමේ අඩුවීම ප්‍රධාන වශයෙන්ම කාර්ය මණ්ඩල පිරිවැය, බාහිර විමර්ෂකයන්ට ගෙවන වෘත්තීය ගාස්තු, ජාත්‍යන්තර ගමන්, පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම්, විදුලිය සහ දුරකථන වැනි උපයෝගිතා වියදම් සහ කාර්‍යාලය තුළ වියදම් වල ප්‍රධාන වශයෙන්ම දක්නට ලැබිණි. අඩු කාර්ය මණ්ඩල පිරිවැය වසරෙන් වැඩි කාලයක් පුරා පුරප්පාඩුව පැවති තාක්‍ෂණික තනතුරු වලට අදාල වන අතර වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස සිදුනොවූ එතෙර ගමන් හේතුවෙන් එතෙර පුහුණුකිරීමේ වියදම අඩුව පැවතිණි. අඩු මෙහෙයුම් වියදමට වාර්තාවේ පෙර විස්තරකර ඇති නිවසේ සිට වැඩ කිරීම පදනම් කරගත් කටයුතු කිරීම හේතුවිය. මෙහෙයුම් වියදම් වලින් කාර්යමණ්ඩල පිරිවැය පූර්ව වර්ෂයට වඩා 11% අඩුවීමක් පෙන්නුම් කරමින් රුපියල් 36,922,897/- ක් වූ අතර ඊට අනුරූප පූර්ව වර්ෂයේ වියදම රුපියල් 41,687,633/- ක් විය. තවදුරටත්, ඉහත විස්තරකර ඇති මෙහෙයුම් වියදම් අඩුවීම නිසා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්යමණ්ඩල පිරිවැය පෙර වර්ෂයේ 53% හා සංසන්දනාත්මකව, 2020 දී මෙහෙයුම් වියදම්වලින් 57% ක් විය.

## 12. සංවර්ධන ව්‍යාපෘති

පහත විස්තර දක්වා ඇති පරිදි, නියාමන ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහා වර්ෂය තුළ ප්‍රාග්ධන ස්වභාවයේ ප්‍රධාන කටයුතු තුනක් කෙරෙහි මණ්ඩලය යොමුවිය.

### 12.1 කාර්‍යාලය පුළුල් කිරීම

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අළුතින් අනුමතවී ඇති සේවක පිරිස් සංඛ්‍යාවේ අතිරේක කාර්‍යය මණ්ඩලයට ස්ථානගත

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

කිරීමට, දැනට බදු පදනමට ගෙන ඇති කාර්යාල පරිශ්‍රයේ පලමු මහලේ අභ්‍යන්තරය සකස් කිරීමේ වැඩ කරගෙන යාම පහසු කිරීමට, 2021 මැද දී අවසන්වීමට නියමිත, දැනට තිබෙන කාර්යාල පරිශ්‍රයේ බදු ගිවිසුම දීර්ඝ කිරීමට ඇති හැකියාව ඇගයීමට ලක් කලේය.

කෝප් කමිටුව විසින් ඉල්ලා ඇති පරිදි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විශාල ප්‍රමාණයක් නියාමනය කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට පහසුව ලබාදෙන, මෙම කාර්‍යාලය පුළුල්කිරීමේ අවශ්‍යතාවය දැනට සිටින සේවක පිරිස් සංඛ්‍යාව ඉහළ නැංවීමට හැකිවීම සඳහා අත්‍යාවශ්‍ය වේ. කුලියට දියහැකි බිම් ඉඩකඩෙහි කුලී අනුපාතයන් සහ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් යෝජිත වටිනාකම් වල වෙළඳපොළ වටිනාකම් සංසන්දනය මත පදනම්ව, සාකච්ඡාකර ඇති අනුපාතයන්ට බදු ගිවිසුම අළුත් කිරීම, සම්පූර්ණ වශයෙන් වෙනත් තැනකට සංක්‍රමනයට වඩා පිරිවැය - ඵලදයකත්වය අතින් වැඩි බව මණ්ඩලය තහවුරු කර ඇත. 2019 වසරේදී සවිස්තර බිම් සැලසුම සහ කොටස් කිරීමේ වැඩ අභ්‍යන්තර සැකසීමේ විග්‍රහය අවසන් කිරීම හා බද්ද ඉදිරියට යාම වසර තුළ දී සුරක්ෂිත කර ගැනීමත් සමග, 2021 මුල් කාලයේ දී තරඟකාරී මිල ගණන් කැඳවීම යලි ආරම්භ කරමින් අභයන්තරය සැකසීමේ වැඩවල ප්‍රගතියක් වසර තුළ මණ්ඩලය බලාපොරොත්තු වේ.

## 12.2 කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සංවර්ධනය කිරීම

දත්ත සමුදය කළමනාකරණ පද්ධතියක් භාවිතය තුළින් සමාලෝචන යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට සහ සමාලෝචන කාර්‍යයන් සුමටව කරගෙන යාමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට දැඩි අවශ්‍යතාවක් ඇති බැවින්, තම අවශ්‍යතා ඉටුකර ගැනීමට කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ලබාගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සැලසුම් අවසන් කොටඇත. ඒ අනුව, 2015 වර්ෂයේ සිට සුදුසු කළමනාකරණ තොරතුරු පද්ධතියක් ලබාගෙන ක්‍රියාත්මක කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යොමු වී ඇත. කෙසේ වුවත්, එකී කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම පහසු කිරීමට තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ නියෝජිත ආයතනය (ICTA) විසින් සැපයීමට බාරගෙන තිබූ මූල්‍ය සහ උපදේශාත්මක සහාය 2016 - 2017 කාලයේ දී ඉවත්කර ගැනීමත් සමග, තාක්‍ෂණික අංශයේ දියුණුවීම් නියාමන යාන්ත්‍රණයට සංයෝජනය කිරීමට වූ සැලසුම් අසාර්ථක විය. ඉන්පසුව, 2019 කාලයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් විවිධ උත්සාහයන් බොහොමයක් ගනු ලැබුවත්, ඒවාද ඵල දැරුවේ නැත.

කෙසේ වුවත්, වර්ෂය තුළ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම නව කළමනාකරණය යටතේ පවතින ICTA වෙත කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධන ව්‍යාපෘතිය යළි ඇරඹීම සම්බන්ධයෙන් එලඹීමක් කළ අතර, සුදුසු කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමට අඛණ්ඩව උපදේශාත්මක සහාය සැපයීමට ICTA එකඟ විය. ඒ අනුව, වර්ෂයේ පසුභාගයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ICTA සමග උපදේශාත්මක සේවා සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීය. වර්තමානයේදී ලියකියවිලි සකස් කිරීම සහ තරඟකාරී මිල ගණන් කැඳවීමට විධිනියමයන් ක්‍රියාවට නැංවීමට අදල වැඩ කෙරෙමින් පවතී.

## 12.3 මූල්‍ය ප්‍රකාශන සමාලෝචන යාන්ත්‍රණය සමාලෝචනය කිරීමට උපදේශකවරයෙකු බඳවා ගැනීම

වඩාත් ඵලදයී ලෙස මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයන් ආවරණය කිරීම උදෙසා වඩා කාර්‍යක්‍ෂමතාවයක් සංයුක්ත කිරීමට දැනට පවත්නා ක්‍රියාවලියට අවශ්‍ය කරන්නාවූ වෙනස්කම් හඳුනා ගැනීමට, මූල්‍ය ප්‍රකාශන නියාමන ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් ඇති උපදේශකවරයෙක් ගේ සේවය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට අවශ්‍ය විය. කැමැත්ත ප්‍රකාශ කිරීම සහ මිල ගණන් කැඳවීමෙන් පසු, එක්සත් රාජධානියේ මූල්‍ය ප්‍රකාශන නියාමන ආයතනයේ සේවය කරන ලද උපදේශකවරයෙක් එක්සත් රාජධානියෙන් බඳවාගන්නා ලදි. කෙසේ වුවද, රටවල් දෙකෙහිම වසා දැමීම හේතුව නිසා සහ යාන්ත්‍රණය සමාලෝචනය කිරීමට ඇති හදිසි අත්‍යාවශ්‍යතාවය නිසා, එකී උපදේශකාත්මක සේවය අතාත්වික සැසිවාර තුළින් ලබාගැනීමට සැලසුම් කෙරිණි. ඒ අනුව, උපදේශකවරයා සේවයේ යොදවා ගැනීමෙන් පසු, 2020 දෙසැම්බර් සිට, දැනට පරිචයේ ඇති පද්ධති සහ ක්‍රියාවලි අවබෝධකර ගැනීමට උපදේශකවරයාට අවශ්‍ය තොරතුරු සපයාදීමේ ක්‍රියාවලියේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම නියුක්තව සිටියි.

## 13. මූල්‍ය ප්‍රකාශන පාරිසරිකය උසස්කිරීම උදෙසා වූ දායකත්වය

නියාමන පාරිසරිකය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව නියාමන යාන්ත්‍රණය පිළිඹඳවත් අනුකූලතාවය දැක්වීමේ අවශ්‍යතාවය පිළිඹඳවත් අස්ථිත්වයන් සහ විගණනවරුන් ගේ දැනුම උසස්කිරීමට ගන්නා උත්සාහයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම පහත දැක්වෙන පියවරයන් ගෙන ඇත.

- 2019 සමාලෝචනයෙන් සොයාගත් දෑ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණනකවරුන් සමග බෙදහද ගැනීමට විධිවිධාන සැකසීමෙන්ද, 2018 තේමාමය විගණන පරීක්‍ෂණ වාර්තාව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ට, විගණන කමිටුවලට සහ විගණකවරුන්ට නිකුත් කිරීමෙන් ද, එම වාර්තාව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමෙන් ද ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ජනතා දැනුවත් භාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.

- ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ප්‍රජාවගේ දැනුම පුළුල් කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස ලංකා වාණිජ මණ්ඩලය විසින් එහි සාමාජිකයන්ට සංවිධානය කල වැඩසටහනක දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්ය මණ්ඩල සාමාජිකයන්

# ක්‍රියාකාරකම් සමාලෝචනය 2020

දෙදෙනෙක් සම්පත් දායකයින් ලෙස සේවය සැපයූ අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ ගණකාධිකරණ පර්යේෂකයින්ගේ සහ අධ්‍යාපනිකයන්ගේ (ICARE) 6 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී කාර්යය මණ්ඩල සාමාජිකයෙක් ඉදිරිපත් කිරීමක් කලේය.

- ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, සමාගම් රෙජිස්ටාර් ජෙනරාල්වරයා සමග මෙන්ම දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා සමගත් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ඇති අනිවාර්ය අවශ්‍යතාවය පිළිබඳව එම එකිනෙක ආයතනවලදී ප්‍රසිද්ධ කිරීම ගැන සන්නිවේදනය කර ඇත. එම අවශ්‍යතාවය පිළිබඳව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දැනුවත් කිරීමට පුවත්පත් ප්‍රචාරණ දැන්වීම්ද පලකර ඇත.

- අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමග එම එකිනෙක ආයතනයේ විෂය නිර්දේශයේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ක්‍රියාකාරකම් ආවරණය වී ඇති ප්‍රමාණය පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සන්නිවේදන පවත්වා ඇත.

### 14. නව සාමාන්‍ය තත්වය දෙසට ආගමනය

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමෙහි නිරතවූවන්, විගණකවරුන් සහ එමෙන්ම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ද කෝවිඩ් 19 වසංගතය බලපෑමේ අත්දැකීමත් සමග කෝවිඩ් 19 වසංගතය කාලය තුළ දී අස්ථිත්වයන්ට සහ විගණනකවරුන්ට සහායවීමට, යොදගතයුතු පියවරයන් පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් 2020 මැයි මාසයේදී දැන්වීමක් නිකුත්කරනු ලැබීණි.

අනතුරුව, වසංගතයේ දෙවන රැල්ල එලඹීමත් සමග, තම වැඩ කටයුතු නොකඩවා පවත්වා ගැනීමට 2021 තුළ දී ඇති වූ නව සාමාන්‍ය තත්වය (New Normal) සමග ඉදිරියට යාම සඳහා ගෙන ඇති පියවරයන් පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම දැන්වීමක් නිකුත් කලේය. එහි, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ සමාලෝචනය, විගණනයන් නිරීක්ෂණය සහ සාමාන්‍ය පරිපාලනය පිළිබඳව ගෙන ඇති නව පියවර සඳහන් විය. මෙම සන්නිවේදනය, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ උනන්දු පාර්ශ්වයන්ට දැන්වීමක් ලෙස නිකුත් කරන ලදී.

# 2020 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය මත කරනු ලැබූ නිරීක්ෂණ

### 1. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණය කිරීම

වර්ෂය තුළ දී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම) නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 694 ක මූල්‍ය ප්‍රකාශන කට්ටල 732 ක් සමාලෝචනය කරන ලදි. සමාලෝචනය කළ මුළු ගණනින්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ගෙන් 45% ක් නියාමනයට ලක් වූ අස්ථිත්වයන් වූ අතර 55% ක් පෞද්ගලික අස්ථිත්වයන් විය. එසේ පෞද්ගලික අස්ථිත්වයන් වැඩි ප්‍රමාණයක සමාලෝචන නිම කිරීමට හේතු වූයේ, රට වසා තිබූ දිගු කාලය තුළ රජය පැන වූ දැඩි සෞඛ්‍ය ආරක්ෂණ පියවර හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත පිවිසීමට තිබූ අවහිරතා හමුවේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම තම සීමිත සම්පත් උපරිම ලෙස යොදා ගැනීමේ ප්‍රතිඵලයක් නිසාය.

මෙම ක්‍රියාවලියේ දී, විමර්ශණය කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්, පනතේ සඳහන් සියළුම කාණ්ඩයන් නියෝජනය වන බව සහතික කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සෑම උත්සාහයක්ම දැරූ අතර ප්‍රායෝගික ලෙස කළ හැකි ප්‍රමාණයට පෞද්ගලික අංශයේ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් චක්‍රිය ලෙස ආවරණය කරන ලදි.

සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම කර්මාන්තය කෙරෙහි යොමුවූ අවදානම් පාදක නිර්පාකයක් මත සිදු කෙරිණි. මූල්‍ය ප්‍රකාශනවල විමර්ශණ කටයුතුවල දී මූල්‍ය ප්‍රකාශන නිත්‍ය විමර්ශණය ලෙස සඳහන් කෙරෙන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තීර්ණ විමර්ශණයක් ලෙස හෝ තේමා කෙරෙහි යොමුවූ විමර්ශණයක් ලෙස සිදු කරන ලදි.

### 2. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ නියාමන සහාය

කෝවිඩ් 19 වසංගතය මධ්‍යයේ දී, නිසිකලට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ නියාමන බලධාරීන්ට ඒවා ඉදිරිපත් කිරීමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් මුහුණ දුන් අතවරයන් දැකීමෙන්, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්ට නියාමන අවශ්‍යතාවයන් සමග අනුකූලතාවය දැක්වීමට හැකියාව ලබාදීම පිණිස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී තොරතුරු කැඳවීමේ දී සහ ලබාගැනීමේ දී පිළිපැදිය යුතු ප්‍රතිව්‍යුහගත කරන ලද ක්‍රියාවලියක් තාවකාලික පියවරක් ලෙස භාවිතා කළ අතර, එය නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් දැනුවත් කිරීම පිණිස මණ්ඩලයේ වෙබ් ජාලයේ ප්‍රකාශ කරන ලදි.

### 3. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනුකූලතාවය දැක්වීම පිලිබඳ සමාලෝචනයේ ප්‍රතිඵල

වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්ගෙන් ප්‍රමාණාත්මකව බැහැර වීම් සොයා ගනු ලැබූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකකින් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී අවශ්‍ය කරන නිවැරදි කිරීම් කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම එකඟතාවයන් ලබා ගත්තේය. 2020 වර්ෂය තුළ දී කරන ලද විමර්ශණ සොයා ගැනීම් වලින්, විමර්ශණය කළ මූල්‍ය ප්‍රකාශන වලින් 1% ක් අනුකූලතාවය නොදක්වන බවත්, විමර්ශණය කළ මූල්‍ය ප්‍රකාශන වලින් 59% ක් අනුකූලතාවය දක්වන බවත්, මූල්‍ය ප්‍රකාශන වලින් 40% ක් උපකාරක ලිපි මගින් සන්නිවේදනය කරනු ලැබූ වැඩිදියුණු කිරීම් සමග අනුකූලතාවය දක්වන බවත් හෙළිදරව් විය. ඔවුන්ගේ අනාගත මූල්‍ය වාර්තා කිරීම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මූල්‍ය ප්‍රකාශන කට්ටල 293 ක් සම්බන්ධයෙන් යෝජිත වැඩිදියුණු කිරීම්, උපකාරක ලිපි මගින් සන්නිවේදනය කරන ලදි.

### 4. මූල්‍ය ප්‍රකාශන විමර්ශණයෙන් සොයාගත් දෑ

#### 4.1 අවශ්‍ය කරන නිවැරදි කිරීම් කිරීමට නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් ලබාගත් එකඟතාවයන්

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්ගේ බැහැරවීමේ ප්‍රමාණාත්මක භාවය මත පදනම්ව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකකින් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය කරන නිවැරදි කිරීම් කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම එකඟතාවයන් ලබාගත්තේය. නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් අනුකූලතාවය නොදැක්වූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්ට (SLFRS/ LKAS පෙර ඇඳිය සහිත) යොමුව සහිතව එකඟතාවයන් ලබාගත් අයිතම වර්ග පහත දැක්වෙන පරිදිවේ;

- SLFRS 15 භාවිතයට ගැනීම නිසා LKAS 18 හා සංසන්දනාත්මකව ජංගම වාර්තාකරණ කාලපරිච්ඡයේ දී මූල්‍ය ප්‍රකාශන රේඛීය අයිතමයන් බලපෑමට ලක්වූ ගණන් නිවැරදිව හඳුනාගැනීමට අපොහොසත්වීම (යොමුව ; SLFRS 15 ඡේදය C3 (b) උපග්‍රන්තය C).
- LKAS 36 මගින් නියමකර ඇති සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩුකරන ක්‍රමයේ දී ආශ්‍රිත සමාගමක ආයෝජනයේ අයකර ගත හැකි අගය තක්සේරු කිරීමේ දී, සාධාරණ අගයේ බහුවිධ ශිල්පක්‍රම භාවිතයට ගැනීමට අපොහොසත් වීම (යොමුව SLFRS 13 ඡේදය B40).

2020 වර්ෂය තුළ දී ලබාගත් එකඟතාවයන් පිළිබඳ විස්තර 22 වන පිටුවේ දක්වා ඇත.

#### 4.2 ප්‍රමිතයන් හා අනුකූලතාවය දැක්වීම ඉහළ නැංවීමට වැඩිදියුණු කිරීම් සන්නිවේදනය

ව්‍යවස්ථාමය ප්‍රතිපාදන භාවිතයෙන් තවදුරටත් ක්‍රියාපටිපාටි භාවිතා කිරීමට තරම් ප්‍රමාණාත්මක නොවන, සොයා ගත් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන් හා අනුකූලතාවය නොදැක්වීම්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ටම අනුකූලතාවය දැක්වීම වර්ධනයකර ගැනීමට හැකිවන පරිදි, අවශ්‍ය තැන් හි දී පුළුල් පරීක්ෂණ නොමැතිව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතට, වැඩිදියුණු කිරීම් ලෙස, ලිපි මගින් දැනුම්දෙන ලදි.

උපකාරක ලිපි ආකාරයෙන් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ට වැඩිදියුණු කිරීම් සන්නිවේදනය කරනු ලැබූ ප්‍රධාන සොයා ගැනීම් පහත දක්වා ඇත.

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 83 ක - මූල්‍ය සාධන පත්‍රවලින්

## 2020 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය මත කරනු ලැබූ නිරීක්ෂණ

අස්ථිත්වය නිරාවරණය වී ඇති අවදානම් වල ස්වභාවය සහ ප්‍රමාණය සහ අපේක්ෂිත ණය අලාභ වල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු වර්ෂය අවසානයේ දී ප්‍රමාණවත් ලෙස හෙළිදරව් නොකිරීම (යොමුව; SLFRS 7, 31 සිට 42 දක්වා වූ ඡේදයන්)

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ 18 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 76 ක - සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවල ස්වභාවය මෙන්ම සම්බන්ධිත පාර්ශවයන් සමග කළ ගණුදෙනු පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් නොකිරීම (යොමුව; LKAS 24 ඡේදය 18 සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වගන්ති අංක 33 ඡේදය 33.9)

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ 25 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 68 ක බදු වියදම සහ ගිණුම්කරන ලාභය අතර සම්භන්ධතාව සහ බදු අලාභ මත විලම්භිත බදු හඳුණාගැනීම තහවුරු කිරීමට සාක්ෂි ප්‍රමාණවත් ලෙස හෙළිදරව් නොකිරීම (යොමුව; LKAS 12 ඡේදය 81 සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වගන්ති අංක 29 ඡේදය 29.32)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 65 ක - සාධාරණ අගයට මනින ලද එකිනෙක වත්කම් හා වගකීම් පංති සඳහා භාවිතා කළ ඇගයීම් ශිල්පක්‍රම, ඇගයීම් ශිල්පක්‍රමවලට යෙදවුම්, භාවිතා කළ සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් වලට කරන ලද සැලකිය යුතු ගැලපීම් සහ සාධාරණ අගයන්හි ධූරාවලියට අදාල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් නොකිරීම (යොමුව; SLFRS 13, 91 සහ 93 යන ඡේදයන්)

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර 13 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 40 ක - එවැනි භාවිතයට නොගත් බදු අලාභ උපයෝගී කර ගැනීමට අනාගතයේ දී බදු අය කළ හැකි ලාභ ලබාගත හැකි ප්‍රමාණය නොසලකා ඉදිරියට ගෙනයන බදු අලාභ හා සම්බන්ධයෙන් විලම්භිත බදු වගකීම් හඳුනා ගැනීමේ දී හෝ විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීමේ දී සියළුම බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සැලකිල්ලට නොගැනීම (යොමුව; LKAS12 හි 15, 24, 34 සහ 48 යන ඡේදය සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වගන්ති අංක 29 ඡේදය 29.12)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 35 ක - මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට අදාල වන්නා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම සහ විශේෂිත ගිණුම්කරන ප්‍රතිපත්ති සහ/හෝ මිණුම්කරණ පදනම් සමන්විත වන්නා වූ සැළකිය යුතු ගිණුම්කරන ප්‍රතිපත්ති සහ අනෙකුත් ගිණුම්කරන ප්‍රතිපත්ති ප්‍රමාණවත් ලෙස හෙළිදරව් නොකිරීම (යොමුව; LKAS 1 හි 112 සහ 117 යන ඡේදයන්)

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර 5 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 17 ක - හානිකරන සූචකයක් පවතිනවිට දී ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කමක අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අලාභ ප්‍රතිපාදනයක් හඳුනා නොගැනීම හෝ මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය පිළිබඳ වාස්තවික සාක්ෂි පවතින විට දී එකිනෙක කාලපරිච්ඡේදය අවසානයේ දී හානිකරණ අලාභ හඳුනා නොගැනීම (යොමුව; SLFRS 9 ඡේදය 5.5.1 සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වගන්ති අංක 11 ඡේදය 11.21)

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 16 ක - මුදලේ කාල අගය පිළිඹිබු කිරීමට මූල්‍ය සාධන පත්‍රයක අපේක්ෂිත ණය අලාභ මැන නොබැලීම (යොමුව; SLFRS 9 ඡේදය 5.5.17)

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර 13 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 28 ක දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනයට සම්බන්ධ සියළුම අදල තොරතුරු හෙළිදරව් නොකිරීම (යොමුව; LKAS 16 හි 77 ඡේදය සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වගන්ති අංක 17 ඡේදය 17.33)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 10 ක - ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වල සාධාරණ අගයන් ප්‍රමාණාත්මක ලෙස ධාරණ අගයෙන් වෙනස් වනවිට දී නිත්‍ය ප්‍රත්‍යාගණනයන් නොකිරීම. (යොමුව; LKAS 16 හි 31 ඡේදය)

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර 2 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපරික ව්‍යවසායයන් 9 ක - වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දී හානිකරණය පිළිබඳ ඇගවීම් පවතින විට දී පවතින වත්කමක අයකර ගත හැකි ගණන ඇස්තමේන්තු නොකිරීම (යොමුව; LKAS 36 හි 8 සහ 9 යන ඡේදයන් සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වගන්ති අංක 27 ඡේදය 27.5)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 9 ක - වත්කම භාවිතයට ගතහැකි කාලයේ දී වත්කමක ක්ෂය වීම් හඳුනා නොගැනීම හෝ භාවිතා කරන ක්ෂයවීම් ක්‍රමය අස්ථිත්වය විසින් අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය කරනු ඇතැයි අපේක්ෂිත රටාව ප්‍රතිබිම්බනය නොකිරීම (යොමුව; LKAS16 හි 55 සහ 60 යන ඡේදයන්)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 8 ක - මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ඉදිරිපත් කිරීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන් හා අනුකූලතාවය සහිතව මූල්‍ය ප්‍රකාශන පිලියෙළ නොකිරීම සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතයන් හා අනුකූලතාවය සහිතව මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහතික කිරීමට අවශ්‍ය සියලු පියවර නොගැනීම (යොමුව; 1995 අංක 15 පනත වගන්තිය 6 (1))

# 2020 වර්ෂය තුළ දී ලබාගත් එකඟතාවයන්

**1. මිලේනියම් හවුසිං ඩිවලොපර්ස් පොදු සමාගම**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතය 15 (SLFRS 15) මුල්වරට භාවිතයට ගැනීම හේතුවෙන්, අයභාරයට වූ බලපෑම හෙළිදරව් කිරීම ප්‍රමාණාත්මකව සාවද්‍ය ලෙස ප්‍රකාශකිරීමක් ඇති කරමින්, මිලේනියම් හවුසිං ඩිවලොපර්ස් පොදු සමාගමේ 2019 මාර්තු 31 දයින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල SLFRS 15 භාවිතයට ගැනීම හේතුවෙන් වූ බලපෑම" ලෙස හෙළිදරව් කල ගණන්වල සැලකිය යුතු කොටසක පෙර වර්ෂයේ (2018) දී අයභාරය හඳුනා ගැනීමේ දී ඇති වූ වැරදි නිවැරදි කිරීමට සම්බන්ධ ගණන් ඇතුළත් විය.

මෙම හේතුව මත විගණකවරයා විගණන මතය තත්වාගණනය කොට නොතිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මගින් කරන ලද විමසීම් වලින් අනතුරුව, LKAS 18 හා සසඳමින්, SLFRS 15 ව්‍යවහාරයට ගැනීමෙන් ඇතිවන්නා වූ නිවැරදි ගණන් යලි තක්සේරුවකින් පසු, ශුද්ධි පත්‍රයක් ලෙස 2019 මාර්තු 31 දයින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි හෙළිදරව්කිරීම් සංසරණයේ යැවීමට සමාගම එකඟ විය.

**2. හික්කඩුව බීච් රිසෝට් පොදු සමාගම**

හික්කඩුව බීච් රිසෝට් පොදු සමාගමේ 2018 මාර්තු 31 දයින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ආශ්‍රිත සමාගම වන කලම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් පොදු සමාගමේ ආයෝජනවල අයකර ගත හැකි අගය තක්සේරු කිරීමේ දී, එකී ආශ්‍රිත සමාගමේ ශුද්ධ වත්කම් වල සාධාරණ අගය මත පදනම් වූ, මුදල් ජනිත කරන ඒකකයේ (එනම් ආශ්‍රිත සමාගමේ) සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමේ ක්‍රමය සමාගම භාවිතාකොට තිබුණි.

එකී ආශ්‍රිත සමාගම වන කලම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් පොදු සමාගමේ ශුද්ධ වත්කම් වල සාධාරණ අගය තක්සේරු කිරීමේ දී, ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් සමාගම විසින් තීරණය කළ, දේපලක සාධාරණ අගය ඇතුලත් කර තිබුණි. කෙසේ වුවත්, එකී අගය ආශ්‍රිත සමාගම වන කලම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දේපලෙහි සාධාරණ අගය ලෙස පිලිඹිබු වූ අගයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් විය.

වෙනස් ඇගයීම් ශිල්ප ක්‍රම භාවිතයෙන් සැලකිය යුතු ලෙස වෙනස් වූ අගයන්ට එළඹ තිබුණි. කෙසේ වුවත්, පරාසය තුළ සාධාරණ අගය වැඩියෙන්ම නියෝජනය වන්නා වූ ශීර්ෂය වෙත ළඟාවීමට අගයන් පරාසයේ සාධාරණ බව සැලකිල්ලට ගනිමින්, ඇගයීම් ශිල්ප ක්‍රම දෙකෙහි සාධාරණ බව ඇගයීමට ලක්කොට නොතිබුණි.

මෙම හේතුව මත විගණකවරයා විගණන මතය තත්වාගණනය කොට නොතිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මගින් කරන ලද විමසීම්වලින් අනතුරුව, ආශ්‍රිත සමාගම වන කලම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් පොදු සමාගමේ ආයෝජනවල ධාරණ අගය නිශ්චිතව දැනගැනීමට හැකි, බහුවිධ ඇගයීම් ක්‍රම භාවිතයෙන් එවැනි ශිල්පක්‍රමවල ප්‍රතිඵල අතර වඩා හොඳ සැසඳීමක් කිරීමට හැකි ආකාරයෙන්, නැවත ඇගයීමක් කිරීමට සමාගම එකඟ විය.

# 2020 තුළ දී විගණන පරීක්ෂණ

### 1. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් විගණන සමීක්ෂණය

ක්‍රියාකාරකම් විමර්ෂණ වාර්තාවේ විස්තරකර ඇති පරිදි, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම) ප්‍රධාන කාර්යයන් දෙකෙන් එකක් වන්නේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශනවල විගණනය කරගෙනයාමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණකවරුන් විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත හා අනුකූලතාවය දැක්වීම සමීක්ෂණය කිරීමයි. විගණනය කරගෙන යාමේ දී ශ්‍රී ලංකා විගණන ප්‍රමිත හා අනුකූලතාවය දැක්වීම නිසැකවම දැනගැනීමට, පොදු භාවිතය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල විගණනයන්හි නියැදියක් පරීක්ෂා කිරීමෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සමීක්ෂණ කාර්යය කරා එලඹෙයි.
විගණන වෙළඳපොළ පරිසරයේ දී විගණනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මයේ විගණන සමීක්ෂණ ක්‍රියාකාරකම් කරගෙන යනු ලැබේ. ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැගීමට දායක වන සහ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනයට සහායවන ඉහළ නැංවූ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාකාරකම් වලට ගුණාත්මක විගණනයන් දායක වේ. වැඩිදියුණු කල, උසස් විගණන ගුණාත්මකභාවයේ දුරස්ථව විහිදී යන යහපත්භාවයන් කෙරෙහි යොමුව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම දැනට පවත්නා ක්‍රියාවලි තුළට ගෝලීය හොඳම පරිචයන් භාවිතයට ගනිමින් විගණන සමීක්ෂණ යාන්ත්‍රණය දියුණු කිරීමට මුල් පියවරයන් කිහිපයක් ගෙන ඇත.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් විගණන සමීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය විශේෂිත නිත්‍ය විගණන පරීක්ෂණ සහ විගණනය පුරාම පූර්ව නිශ්චිත තේමාවක් පිළිබඳ විස්තීර්ණ විමර්ෂණයක් පිළිබඳව යොමුවන තේමා විගණන පරීක්ෂණ ලෙස දෙයාකාරයකින් කරගෙන යනු ලැබේ. අවදනම් පාදක එළඹුම සලකාබැලීමෙන් මෙන්ම අහඹු ලෙස තෝරා ගැනීමේ එළඹුම මත ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම පරීක්ෂණ සඳහා විගණන තෝරා ගනී. අඛණ්ඩව කරගෙන යනු ලබන වැඩිදියුණු කිරීම් සඳහා, වර්ෂය තුළ දී, 2021 සිට භාවිතයට ගැනීමට අපේක්ෂිත, පරීක්ෂණ සඳහා විගණන තෝරා ගැනීමට නව අවදානම් පාදක එළඹුමක් සංවර්ධනය කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම නව උත්සාහයක් යනු ලැබීය.

### 2. විගණනය කෙරෙහි කොවිඩ් 19 යේ බලපෑම

කොවිඩ් 19 පැතිරයාම අඩුකිරීම සඳහා ගත් සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ගයන් විගණන කර්මාන්තය කෙරෙහිද බලපෑම් ඇතිකලේය. සංචරණ සීමා සහ දුරස්ථ වැඩ වාතාවරණයන් බොහෝ විගණනකවරුන්ට දුරස්ථ ස්ථානවල සිට විගණනයන් කරගෙන යාමට හේතු සාධක විය.

දුරස්ථ-පාදක විගණනයන් කරගෙන යාම පිණිස තොරතුරු තාක්ෂණය මත ඉහළ රඳාපැවැත්මක් අවශ්‍ය වේ. දුරස්ථව විගණනයන් කරගෙනයාම දෙසට මාරුවී ඇති සංවර්ධිත තොරතුරු තාක්ෂණ පද්ධති ඇති රටවල්වල මෙය දක්නට ඇත. කෙසේවුවත්, ශ්‍රී ලංකාවේ දී, දැනට ඇති තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් මත පදනම්ව විගණනයන් කරගෙනයාමේදී විගණනකවරුන්ට බොහෝ අභියෝගවලට මුහුණ දීමට සිදුවේ. මෙම තත්වය විගණන ක්‍රමවේදයන් ඩිජිටල්කරණය පදනමට ගෙන ඒමට විගණන ආයතනවලට නව අවස්ථා ලබා දී ඇත. ගෝලීය වශයෙන්, ජාත්‍යන්තර ජාලයන්හි සාමාජිකයන් ද ඔවුන්ගේ විගණන ක්‍රමවේදයන් ඩිජිටල්කරණය පදනමට ගෙන ඒමට කටයුතු කරමින් සිටියි. ජාත්‍යන්තර මට්ටමේ දී නව ප්‍රවනතාවයක් ලෙස මෙම මාරු වීම සාක්ෂි දරයි.

වාර්තාකරණයට අවසන් දින වකවානු අනුව කටයුතු කිරීමේ දී කාල පීඩනය ලෙස ද විගණනකවරුන් විසින් මෙම බලපෑම අත්දකිනු ලබයි. කෙසේ වුවත්, කොළඹ කොටස් වෙළඳපොළ විසින් වාර්තාකරණ දින වකවානුවලට කරන ලද දීර්ඝ කිරීම් මේ සම්බන්ධයෙන් විගණනකවරුන්ට නිසැකවම උපකාරී වී ඇත.

සාමාන්‍යයෙන්, විගණනය කරගෙනයාමේදී දුරස්ථ විගණනය, කාල සීමාවීම්, තොරතුරු ලබාගැනීමට ඇති හැකියාව, කළමනාකරණය සමග භෞතිකව හමුවීම වැනි අංශයන් හි සියළුම විගණනකවරුන් අභියෝගවලට මුහුණ දී ඇත. පරිශීලන සීමා නිසා විගණන සාක්ෂි රැස්කිරීමේදී වූ දුෂ්කරතාවයන් ගේ ප්‍රතිඵලය වූයේ හුරුපුරුදු කඩදසි භාවිතය වෙනුවට ඩිජිටල්කරණය පදනම ආකාරයෙන් තොරතුරු ලැබීමයි. භෞතික නොවන ආකාරයෙන් වූ සාක්ෂි මත ඉහළ රඳා පැවැත්ම නිසා විගණනයේ විවිධ පැතිකඩ වලට විගණනකවරයාගේ වෘත්තීය විනිශ්චය අවශ්‍ය කරන අතර එවැනි සාක්ෂිවල වලංගුභාවය සහතික කර ගැනීම සඳහා අතිරේක ක්‍රියාපටිපාටි කරගෙන යාමට ද අවශ්‍ය වේ.

අස්ථිත්වයන්ට නිත්‍ය අභ්‍යන්තර පාලන පියවරයන්ගෙන් බැහැරව දුරස්ථ මෙහෙයුම් කරගෙනයාමට සිදුවීම නිසා අස්ථිත්වයන් විසින් ගනුලැබූ පාලන පියවරයන් සම්පව සමීක්ෂණය කිරීමට විගණනකවරුන්ට බලපෑම් ඇත. අතිරේකව, අස්ථිත්වයන්ගේ මෙහෙයුම් පරිසරයට වසංගතයෙන් ඇතිවූ බලපෑම වත්කම් ඇගයීම (වත්කම් හාණිකරණය, මූල්‍ය වත්කම් වල අපේක්ෂිත ණය අලාභ සහ විලම්බිත බදු වත්කම් පියවා ගැනීම වැනි) සහ වගකීම් වල සම්පූර්ණත්වය තක්සේරු කිරීම ආශ්‍රිත විගණන අවදානම කර ඇත. තවදුරටත්, කොවිඩ් 19 වසංගතයෙන් ව්‍යාපාර කටයුතුවලට ඇති වූ බලපෑම හේතුවෙන් අස්ථිත්වයට අඛණ්ඩ පැවැත්මක් සහිතව කටයුතු කරගෙන යාමට ඇති හැකියාව ගැන සැලකිය යුතු සැක ඇති කරන සිද්ධි හෝ තත්වයන් පිළිබඳ සාක්ෂි කෙරෙහි සෝදිසියෙන් සිටීමට විගණනකවරුන්ට සිදු වී ඇත. ඒ අනුව, මෙම අභියෝගාත්මක කාලයේ දී, විගණන කරගෙන යාමේ දී සැලකිය යුතු වෘත්තීය විනිශ්චයන් ක්‍රියාවේ යෙදවීමටත් විමසිලිමත්ව සිටීමට සහ ආචාර ධර්මානුකූල වගකීම් කෙරෙහි යොමුව සිටීමටත් ඉහත සඳහන් අභියෝග විගණනකවරුන්ට අවශ්‍යකර ඇත.

# 2020 තුළ දී විගණන පරීක්ෂණ

### 3. බලාත්මකකිරීමේ ක්‍රියාවන්

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විගණන පරීක්ෂණවල දී කරන ලද නිරීක්ෂණවල බරපතලකම අනුව, ශ්‍රී ලංකාව තුළ විගණන ගුණත්ව පරිසරය වැඩි දියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස විගණනකවරුන්ට ස්වයංව වැඩි දියුණුවීමට යොමු කිරීමට ගත් උත්සාහයේ දී, විවිධාකාර පියවරයන් යොදා ගෙන ඇත.

නිත්‍ය විගණන පරීක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස සොයාගන්නා ප්‍රමිතයන් හා අනුකූලතාවය නොදැක්වීම ව්‍යවස්ථාවන් යටතේ තවදුරටත් ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් භාවයකින් යුක්ත නොවනවිට එවැනි ඌනතාවයන් “නිරීක්ෂණ ලිපි” නමින් හැඳින්වෙන උපකාරක ලිපි මගින් විගණන ආයතන වෙත සන්නිවේදනය කරනු ලැබේ. විගණන ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට විගණන වල වැඩි දියුණු කිරීම් අවශ්‍ය වන විටදී, එවැනි වැඩි දියුණු කිරීම් “වැඩි දියුණු කිරීම සඳහා වූ යෝජනා” ලෙස සන්නිවේදනය කරනු ලැබේ. ඊට අතිරේකව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණනය කරගෙන යාමේදී වෘත්තීය දක්ෂතාවය සහ නිසි සැලකිල්ල යන මූලික සුශීල මූලධර්මයන්ට අනුව කටයුතු කිරීමට විගණනකවරයා අපොහොසත්වී ඇතිබවට නිරීක්ෂණය වූ විට, අනාගතයේදී, මූල්‍ය ප්‍රකාශන විගණනය කරගෙනයාමේදී, අදාල විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීමට එකී විගණන ආයතනවලට අවශ්‍යකරමින්, මණ්ඩලයේ අනුමැතිය ඇතිව, විගණන ආයතනය වෙත අනතුරු ඇඟවීමේ ලිපියක් (Warning Letter) නිකුත් කෙරේ. තවදුරටත්, ප්‍රමිතවලින් බැහැරවීමේ බරපතලකම මත පදනම්ව, අවශ්‍ය කරනවිට දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම බැහැර වීම් සම්බන්ධයෙන් ගතයුතු පියවර සඳහා නීතිපතිවරයාගේ උපදෙස් ලබාගැනීමට කටයුතු කරන අතර විගණන ගුණත්වය තුළ ඌනතාවයන් ඇතිවිට, එවැනි කරුණු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ විගණිත ආයතනයට අදාල වෙනත් මූල්‍ය අංශයේ නියාමකයන් දැනුවත් කරයි.

2020 තුළ දී, එක් විගණන පරීක්ෂණයක් නීතිපති වරයා වෙත යොමු කෙරුනු අතර ඒ පිලිබඳ අදාළ කටයුතු සිදුවෙමින් පවතී.

### 4. නිත්‍යවිගණන පරීක්ෂණ

2019 තුළ දී විගණන ආයතන 7 ක් විසින් කරන ලද විගණන 33 ක් සමග සැසඳෙන විට 2020 වසර තුළ දී විගණන ආයතන 7 ක් විසින් කරන ලද විගණන 27 ක් පිලිබඳව නිත්‍ය විගණන පරීක්ෂණ කරගෙන යන ලදි. 2020 වර්ෂය තුළ දී පරීක්ෂණ සඳහා සිටි කාර්‍ය මණ්ඩලය අඩුවීම විගණන පරීක්ෂණ මුළු ගණන 2019 තුළ දී කල ගණනට වඩා අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවදුරටත්, සමාජ දුරස්ථභාවයට වූ අවශ්‍යතාවය සහ විගණන පරීක්ෂණ කරගෙනයාමේදී සෘජු සම්බන්ධතා පවත්වාගැනීමට වූ පරිශීලන සීමා කිරීම් නිසා, තේමාමය විගණන පරීක්ෂණ කරගෙන යාමට වූ සැලසුම් යලි ඇගයීමට ලක් කෙරිණි. එමගින් විගණනයට ලක්වූ අස්ථිත්වයන්ගේ මෙහෙයුම් කෙරෙහි කොවිඩ් 19 යේ බලපෑම සලකා බැලීමේදී විගණකවරුන් විසින් කරගෙන ගිය විගණන ක්‍රියාපටිපාටිවල යෝග්‍යතාවය විමර්ෂණය කිරීමට අතිරේක කාලය කැපකිරීමට වූ අවශ්‍යතාවයත් සමග, පරීක්ෂණ නිත්‍ය විගණන පරීක්ෂණවලට සීමාවිය.

තවදුරටත්, වර්ෂය තුළ දී , 2018 දී පැවැත්වූ තේමාමය විගණන පරීක්ෂණවලින් සොයාගත් දෑ පිලිබඳ වාර්තාව අවසන්කර ප්‍රසිද්ධ කරන ලදි.

### 4.1 උපකාරක ලිපි

බලාත්මකකිරීමේ ක්‍රියා යටතේ යොමුකර ඇති පරිදි, සොයාගන්නා ප්‍රමිතයන් හා අනුකූලතාවය නොදැක්වීම පිලිබඳ සොයාගත් දෑ ව්‍යවස්ථා යටතේ තවදුරටත් ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් නොවනවිට, එවැනි ඌනතාවයන් “නිරීක්ෂණ ලිපි” නමින් හැඳින්වෙන උපකාරක ලිපි මගින් විගණන ආයතන වෙත සන්නිවේදනය කරනු ලැබේ. එවැනි ඌනතාවයන් විගණන ආයතන 4 ක් විසින් කරන ලද විගණන කාර්‍යයභාර ගැනීම් 4 කදී හඳුනාගන්නාලදි.

සන්නිවේදනය කල සැලකිය යුතු ඌනතාවයන්ට ඇතුලත් වන්නේ:

#### 4.1.1 යෝග්‍ය විගණන මතයක් ප්‍රකාශ කිරීමට අසමත්වීම

විගණකවරයා විසින් යෝග්‍ය විගණන මතය ප්‍රකාශ කිරීමට අසමත්වීම පහත සඳහන් අවස්ථාවලදී නිරීක්ෂණය විය;

- මූල්‍ය වාර්තාවල වැදගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූල නොවීම් අඩංගුව පැවතියදී, ප්‍රමාණවත් සියළුම ආකාරයන්ගෙන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූලව මූල්‍ය වාර්තා පිලියෙළකර ඇති බවට විගණකවරයා නිගමනය කර තිබුණි.

#### 4.1.2 ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට අසමත්වීම

ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට විගණකවරයා විසින් අසමත්වීම පහත සඳහන් පරිදි නිරීක්ෂණය විය;

- ආයභාරය ලුහුකම් ක්‍රියාවලියේ නිවරද්‍යභාවය තක්සේරු කිරීමට, පෙර වර්ෂය හා සැසඳීමේ දී ආයභාරයේ අසාමාන්‍ය විචලනයන් හඳුනාගැනීම හා ඇගයීමට අදාලව යෝග්‍ය පරිදි තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි කරගෙන නොයෑම සහ ආයභාරය සිදුවීම, සම්පූර්ණත්වය සහ අගයකිරීම සත්‍යෙක්ෂණය කිරීමට අසමත්වීම.

- කළමණාකරණයේ විශේෂඥවරයාගේ නිපුණතාවය, හැකියාවන් සහ විෂය මූලිකභාවය පිලිබඳව යොමුවෙමින්, විශේෂඥවරයාගේ

# 2020 තුළදී විගණන පරීක්ෂණ

වැඩකටයුතු ගැන අවබෝධයක් ලබාගනිමින් සහ අදාල කරුණුදැක්වීම් සඳහා විගණන සාක්ෂි ලෙස විශේෂඥවරයාගේ වැඩකටයුතුවල යෝග්‍යතාවය ඇගයීමෙන් ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය සත්‍යාපණයකිරීමට ප්‍රමාණවත් විගණන ක්‍රියාපටිපාටි කරගෙන නොයෑම

#### 4.1.3 සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණන ක්‍රියාපටිපාටි කරගෙනයාමට අසමත්වීම

සාධාරණ අගය ඇස්තමේන්තු පිලිබඳව යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට විගණකවරයා අසමත්වීම පහත සඳහන් අවස්ථා වලදී නිරීක්ෂණය විය;

- මූල්‍ය සමාගමක හානිකරණ ගණනයකිරීම සඳහා උපකල්පනයක් කරා එලඹීමට භාවිත කළ දත්තවල පරිපූර්ණත්වය සහතික කිරීමට යෝග්‍ය විගණන ක්‍රියාපටිපාටි කරගෙන නොයෑම.

### 4.2 වැඩිදියුණු කිරීම සඳහා වූ යොජනා

විගණන ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා විගණනයන් තුළ වැඩිදියුණු කිරීම් අවශ්‍යවන විට, එවැනි වැඩිදියුණු කිරීම් යෝජනා වශයෙන් සන්නිවේදනය කරනු ලැබේ.

වර්ෂය තුළ දී, විගණන කාර්ය බාරගැනීම් 10 කට අදාලව විගණන ආයතන 6 කට වැඩිදියුණු කිරීම සඳහා වූ යොජනා සන්නිවේදනය කෙරිණි. එවැනි විගණන ආයතනවල විගණකවරුන් ඔවුන්ගේ අනාගත විගණනවලදී හඳුනාගත් ක්ෂේත්‍රවල වැඩිදියුණු කිරීම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්ෂය තුළ දී සන්නිවේදනය කරනු ලැබූ වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනාවලට ඇතුලත් වන්නේ;

- ඉහළ මට්ටමකදී රැස්කරගත් දත්ත එවැනි විග්‍රහාත්මක ක්‍රියාපටිපාටි වලදී භාවිතයට ගෙන ඇතිවිට, අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි වශයෙන් කරගෙන යනු ලැබූ විග්‍රහාත්මක ක්‍රියාපටිපාටි වල ප්‍රථිපල තේරුම් ගැනීමට සහ ඇගයීමට එකතු කරගත් වෙනත් තොරතුරු සලකා බැලීමට.
- ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන් හඳුනා ගැනීමට වැඩිදුර විමසීම් කරමින් විගණන නියැදියේ ප්‍රතිබිම්බනය වී ඇති අස්වාභාවික තත්වයන් සඳහා හේතු තක්සේරු කිරීමට.
- විගණන නියැදියක් තෝරා ගැනීමේදී, සාක්ෂාත්කර ගැනීමට නියමිත විශේෂිත අරමුණ සහ නියැදිය තෝරාගනු ලබන සංගහණයේ ලක්ෂණ සලකා බැලීමට.
- අස්ථිත්වය විසින් කල ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණ බව සහතික කිරීම සඳහා කළමණාකරණය විසින් භාවිතයට ගෙන ඇති උපකල්පන සෑහෙන පරිදි අභියෝගයට ලක් කිරීමට
- කළමණාකරණයේ කරුණු දැක්වීම් ලබාගත් බව තහවුරු කිරීම සඳහා සහ විගණන එළඹුමේ අවබෝධ කරගත හැකිබව පවත්වා ගැනීමට විගණන කාර්‍යය පත්‍රිකාවල, කරගෙනයනු ලැබූ සියළුම විගණන ක්‍රියාපටිපාටි ප්‍රමාණවත් ලෙස ලේඛණගත කිරීමට
- කරගෙනයනු ලැබූ එකිනෙක විගණන ක්‍රියාපටිපාටියෙන් කරනු ලැබූ නිගමන අදල විගණන ක්‍රියාපටිපාටිය හා සම්බන්ධබව සහ ලබාගත් සාක්ෂ්‍ය විගණන කාර්‍යය පත්‍රිකාවල ලේඛණගත කිරීම සහතික කිරීමට.
- මූල්‍ය වාර්තාවල තනි ජේඛීය අයිතමයක් ලෙස අයභාරය ඉදිරිපත් කරනවිට, තනිව සලකාබලන විට ප්‍රමාණවත් බවේ මට්ටමට වඩා අඩු, ලුහුකම් අයභාර කාණ්ඩයන් හා සම්බන්ධව හඳුනාගත් බැහැරවීම් වල සමස්ථ බලපෑම ඇගයීමට.
- සැලසුම් කිරීමේ මට්ටමේදී නිර්මාණය කල නියැදි වලින් බැහැරවීම් සඳහා හේතු ලේඛණගත කිරීමට.

## 5. තේමාමය විගණන පරීක්ෂණ

### 5.1 තේමාවේ යොමුව

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් විගණන ආයතනයේ තෝරාගත් විගණන කාර්ය බාරගැනීම් පරීක්ෂාකිරීමෙන්, එවැනි ආයතනයක විගණනයේ විශේෂිත ක්ෂේත්‍රයක් හෝ පැතිකඩක් වෙනුවෙන් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කෙරෙහි යොමුවීම අඛණ්ඩව කරගෙන යාමත් සමග 2017 දී තේමාමය විගණන පරීක්ෂණ ආරම්භ විය. සියළුම පරීක්ෂණවලින් සොයාගත් දෑ එකට වාර්තාකිරීම මගින්, සොයාගත්දෑ සංසන්දනයක් ඇතුලත් කරන අතර තෝරාගත් තේමාවට හෝ විශේෂිත ක්ෂේත්‍රයට අදල හොඳ පරිචයන් සහ පොදු දුර්වලතා ඉස්මතුකර පෙන්වයි.

2020 තුළ දී, ලයිස්තුගත අස්ථිත්වයන්ගේ මූල්‍ය වාර්තා විගණනයේදී යහපාලනය භාරකරුවන් (TCWG) සමග සන්නිවේදනය යන තේමාව යටතේ විගණන ආයතන 5 ක විගණන 19 ක් වෙනුවෙන් 2018 තුළ දී කරගෙන ගිය තේමාමය විගණන පරීක්ෂණ වාර්තාව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම නිකුත් කලේය. විගණකවරයා සහ යහපාලනය භාරකරුවන් අතර ද්වි-මාර්ගික ඵලදායී සන්නිවේදනය සහ රටේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය උසස්කිරීම සඳහා එහි දායකත්වය සලකා බැලීමේදී එකී තේමාව යෝග්‍ය බවට හඳුනා ගැණිනි. පරීක්ෂණ ක්‍රියාවලිය තුළ, එකී

# 2020 තුළ දී විගණන පරීක්ෂණ

ද්වි-මාර්ගික සන්නිවේදනයේ කාලානුරූපීබව සහ ඵලදායිකත්වය ගැන ගැඹුරට දැනගැනීම සඳහා විගණනයට ලක්වන අස්ථිත්වයන්ගේ විගණන කමිටු ප්‍රධානීන්ගේ පසුවිපරම් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ලබාගත්තේය.

## 5.2 සොයාගත් කරුණු

2018 තුළ දී කරගෙන ගිය තේමාමය විගණන පරීක්ෂණ වලින් සොයාගත්දෑ 2020 තුළ දී නිකුත් කල තේමාමය විගණන පරීක්ෂණ පිලිඹඳ සවිස්තරාත්මක වාර්තාවේ ඇතුලත් වන අතර එය www.slaasmb.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධකර ඇත.

ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිත හා අනුනූලතාවය දැක්වීම සමාලෝචනය කරන නියාමක වන ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, විගණකවරයා, යහපාලනය භාරකරුවන් සහ නියාමක යන පාර්ශව තුන අතර හොඳ සන්නිවේදනයක් ඇති කිරීමට උනන්දු කරයි. පරීක්ෂණ කාලය තුළ හඳුනාගත් හොඳ පරිචයන් භාවිතයට ගැනීමෙන් බලාපොරොත්තුවන වැඩිදියුණු කිරීම් සලකා බලා, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම 2020 තුළ දී නිකුත් කල තේමාමය විගණන පරීක්ෂණ පිලිඹඳ වාර්තාවේ පිටපත් සියළුම විගණන ආයතන, ලයිස්තුගත අස්ථිත්වයන්ගේ සභාපතිවරුන් සහ ලයිස්තුගත අස්ථිත්වයන්ගේ විගණන කමිටු සභාපතිවරුන්ට බෙදා දුන්නේය.

යහපාලනය භාරකරුවන් (TCWG) සමග විගණකවරයාගේ ඵලදායී සන්නිවේදනයට අදාලව 2020 තුළ දී නිකුත් කල තේමාමය විගණන පරීක්ෂණ පිලිඹඳ වාර්තාවේ හඳුනාගත් වැදගත් ලක්ෂණයන් පහත දැක්වේ.

## 5.3 ද්වි-මාර්ගික සන්නිවේදනය ඵලදායී කිරීම පිලිඹඳ මූලික පරීක්ෂණ සොයාගැනීම්

- යෝග්‍ය පුද්ගලයා යහපාලනය භාරකරුවන් (TCWG) ලෙස සැලකීම - යහපාලනය භාරකරුවන් ලෙස සැලකිය යුතු පුද්ගලයා තීරණය කිරීමේදී විගණකවරයාගේ වෘත්තීය විනිශ්චය සහ එවැනි තීරණ වලදී යථායෝග්‍යභාවය ද්වි-මාර්ගික සන්නිවේදනය සඳහා මූලික කරුණක් වේ.
- සන්නිවේදන ක්‍රියාවලිය කල් ඇතිව පිහිටුවා ගැනීමේ වැදගත්කම - සන්නිවේදන ක්‍රියාවලිය සැලසුම් අදියරේ දී පිහිටුවා ගැනීම ද්වි-මාර්ගික සන්නිවේදනයේ ඵලදායීතාවය උසස්කිරීමට උපකාරීවේ.
- අස්ථිත්වයේ යහපාලන ව්‍යුහය සන්නිවේදනයට බලපෑම- අස්ථිත්වයේ යහපාලන ව්‍යුහය සන්නිවේදන ක්‍රමයට සහ සන්නිවේදනය කරන කරුණුවලට බලපායි. ඒ අනුව, සන්නිවේදන ක්‍රමය සහ සන්නිවේදනය කරන කරුණු ආයතනයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මත අවශ්‍යයෙන්ම තීරණය නොවේ.
- කාර්යය භාර ගැනීමේ ලිපි භාවිතය - කාර්යයභාර ගැනීමේ ලිපිය මූල්‍ය වාර්තා විගණනය කෙරෙහි විගණකවරයාගේ වගකීම් සන්නිවේදනය කරන මූලික මෙවලම ලෙස භාවිතා කරයි. විගණන-නොවන සේවා සඳහා වෙනම කාර්යයභාරගැනීමේ ලිපි භාවිතා කරයි.
- සන්නිවේදන ක්‍රමය - රැස්වීම්, ඉදිරිපත් කිරීම් සහ ලිපි විගණනයේ විවිධ අවධිවලදී පොදු සන්නිවේදන ක්‍රම වේ.
- යහපාලනය භාරකරුවන් (TCWG) ගේ අභ්‍යන්තර දැනුම - එවැනි රැස්වීම් සහ ඉදිරිපත් කිරීම් වලදී යහපාලනය භාරකරුවන් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම ද්වි-මාර්ගික සන්නිවේදනය සඳහා ප්‍රයෝජනවත් වන අතර පාර්ශව දෙකෙහිම ඵලදායී තීරණගැනීම කෙරෙහි දායකවේ.
- ද්වි-මාර්ගික සන්නිවේදනය පිලිබඳ සාක්ෂි - විගණකවරයා විසින් පවත්වාගන්නා රැස්වීම් වාර්තා හෝ අස්ථිත්වය මගින් පවත්වාගන්නා රැස්වීම් වාර්තාවල උද්ධෘතයන් විගණනය කරන අතරතුර පැවති ද්වි-මාර්ගික සන්නිවේදනය පිලිබඳ සාක්ෂි සපයන මූලික දේ වෙයි.

## 5.4 විගණන කමිටු සාකච්ඡා වල ඉස්මතුවන කරුණු

- අස්ථිත්වයේ යහපාලන ව්‍යුහය සහ නියාමන බලපෑම් විගණන කමිටුවේ යුතුකම් සහ වගකීම් ඵලදායී ලෙස ඉටුකිරීමට බලපායි. නියාමනයට ලක්වන අස්ථිත්වයන් සහ පුද්ගල බලපෑමට ලක්නොවූ අස්ථිත්වයන් විගණන කමිටුවලට තම විනිශ්චයන් කිරීමට වැඩි නිදහසක් සපයයි.
- විගණකවරයා පත්කිරීම, විගණන ගාස්තු තීරණය කිරීම, විගණන-නොවන සේවා ලබාගැනීම සහ විගණකවරයාගේ ස්වාධීනත්වය පවත්වාගැනීම සහතික කිරීමට විගණන කමිටුව ප්‍රධාන කාර්යයභාරයක් කරයි.
- විගණන කමිටුව විගණන ක්‍රියාදාමය තුළ ක්‍රියාකාරී ලෙස නියුක්තව සිටීම සහ කළමණාකාරීත්වය නොමැතිව විගණකවරුන් හමුවීම, විගණන අපේක්ෂා පරතරය අවමකිරීමට දායකවෙයි.
- මූල්‍ය නිපුණතාව සහිත පුද්ගලයන් විගණන කමිටුවල මූලසුන දැරීම විගණන කමිටු ඵලදායී ලෙස ක්‍රියාත්මකවීමට දායකවෙයි.

# 2020 තුළ දී විගණන පරීක්ෂණ

**6. විගණන ගුණාත්මකභාවය උසස්කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ගෙන ඇති අනෙකුත් පියවර**

**6.1 විගණන පරීක්ෂණවලින් සොයාගත් කරුණු විගණන කමිටුවලට සන්නිවේදනය කිරීම**

කොළඹ කොටස් වෙළඳපොලෙහි ලයිස්තුගත අස්ථිත්වයන්ගේ විගණන කමිටුවලට තම රාජකාරි ඵලදායීලෙස කරගෙන යාමට සහයවීමට, වර්ෂය තුළ දී , විගණන පරීක්ෂණවල ප්‍රතිපල විගණන කමිටුවලට සන්නිවේදනය කිරීම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ආරම්භ කලේය. සමාගමේ මූල්‍ය වාර්තා විගණනයේ ගුණාත්මකභාවය පිලිබඳ ගැඹුරු දැනුමක් විගණන කමිටුවලට ලබාදීම මෙම පියවර මගින් බලාපොරොත්තු වේ.

**6.2 විගණන ගුණාත්මකභාවයට සහයවීමට ජාත්‍යන්තර සම්බන්ධතා**

6.2.1 ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) - 2007 වර්ෂයේ දී පැවැත් වූ පළමු පූර්ණ රැස්වීමේ සිට සාමාජිකත්වය දරයි. වර්ෂය තුළ දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අතාත්වික ලෙස පැවැත්වූ (IFIAR) සංසදයේ රැස්වීමට සහභාගි වූ අතර (IFIAR) සංසදයේ තොරතුරු අවශ්‍යතාවයන් පරිපූර්ණකර කිරීමට ද නිරතුරුව පැවැත්වෙන සමීක්ෂණවලට ද සහභාගී විය.

6.2.2 ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ජාත්‍යන්තර විගණන හා තහවුරු කිරීම් ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශාත්මක නිර්දේශකිරීමේ කණ්ඩායමේ 2007 වර්ෂයේ සිට සාමාජිකයෙකු වන අතර ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාරධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශාත්මක නිර්දේශකිරීමේ කණ්ඩායමේ - 2009 වර්ෂයේ සිට සාමාජිකයෙකු වෙයි. වර්ෂය තුළ දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විගණනය හා ආචාරධර්ම වලට අදාල ප්‍රමිති පිලිබඳව විචාරාත්මක සාකච්ඡාකල දුරස්තව පැවති රැස්වීම් වලට අඛණ්ඩව දායකවිය.

**6.3. ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) විසින් සොයා ගැනීම් සහිත විගණන 25% කින් අඩු කිරීමේ ක්‍රියාවලියට මුල පිරීම**

ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) ගෝලීය පදනමක් මත විගණනවල ගුණාත්මක භාවය දියුණු කිරීමට කැපවී සිටින අතර සංසන්දනය සඳහා පාදක වසර ලෙස 2019 දී කල සමීක්ෂණයේ සොයාගැනීම් සලකාබලමින්, සොයාගැනීම් සහිතව පරීක්ෂණ කෙරෙන විගණන 25% කින් අඩුකිරීමේ නව මුල පිරීම, IFIAR සංසදය 2019 දී දියත් කලේය.

බීඩීඕ, ඩෙලොයිට්, අර්නස්ට් ඇන්ඩ් යං, ග්‍රාන්ට් තෝර්න්ටන්, කේපීඑම්ජී සහ ප්‍රයිස්වෝටහවුස්කූපර්ස් ඇතුලත් ගෝලීය ප්‍රසිද්ධ ප්‍රතිපත්ති කමිටු (GPPC) විගණන ආයතන, ඊළඟ වසර හතර තුළ දී ලයිස්තුගත මහජන ඇල්ම සහිත අස්ථිත්වයන් (PIE) හා සම්බන්ධ සොයාගැනීම් වල ප්‍රතිපල අවම වශයෙන් 25% කින් අඩුකිරීමට සාපේක්ෂව මැනීමට IFIAR සංසදය හා එකඟත්වය පලකොට ඇත.

ඒ අනුව, සමීක්ෂණ කාලය තුළ දී අවසන් කල පරීක්ෂණවලින් එකී ජාත්‍යන්තර ජාලයන්හි දේශීය විගණන ආයතන වලට අදල සොයාගැනීම් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම IFIAR සංසදයට ඉදිරිපත් කිරීම 2019 න් ආරම්භ කරමින් වාර්ෂික පදනමක් මත කරගෙන යාමට එකඟ වී ඇත.

# ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර

| ආයතනික කාර්ය සාධනය සම්බන්ධ ගැටළු | සැලසුම් කරන ලද කෙටිකාලීන පියවර | සැලසුම් කරන ලද දිගුකාලීන පියවර |
|---|---|---|
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය යන නිර්වචනය තුළට ගැනෙන සියලුම ආයතන ආවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන ලැබීම පුළුල් කිරීම | • නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හඳුනා ගැනීම සඳහා සම - නියාමකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ලැයිස්තු පසු විපරම් කිරීම<br>• නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි නිර්ණායක සපුරා තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා හඳුනාගත් ආයතන පිළිබඳව පසු විපරම් කිරීම<br>• මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සම-නියාමකයන්ගේ පාර්ශවකරුවන් තුළ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම<br>• පුවත්පත්වල සහ වෙබ් අඩවියේ නිතිපතා ප්‍රකාශන පළකිරීම | පැනවීමට නියමිත නව පනත හරහා මේ පිළිබඳව කටයුතු කිරීම |
| මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ආවරණය වැඩි කිරීම | • මූල්‍ය ප්‍රකාශනවල මූලික සමාලෝචන සිදු කිරීම සඳහා වැඩිපුර බාහිර සමාලෝචකයින් සම්බන්ධ කර ගැනීම<br>• මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සම්පූර්ණ කිරීමට දැනට සිටින කාර්ය මණ්ඩලයට සහාය වීමට සීමාවාසිකයින් සම්බන්ධ කර ගැනීම | සමාලෝචනය කිරීමට වඩාත්ම සුදුසු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව පිළිබඳව සහ ගෝලීය හොඳම භාවිතයන් සැලකිල්ලට ගනිමින් වඩාත් ඵලදායී මූල්‍ය ප්‍රකාශන සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳව උපදේශකවරයාගේ නිර්දේශ යොදාගැනීම.<br><br>ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පිළිබඳ මනා දැනුමක් ඇති වරලත් ගණකාධිකාරීවරුන් බඳවා ගැනීම සඳහා අදාළ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ පවතින වැටුප් පරිමාණයන් සහ පළපුරුද්ද අවශ්‍යතා පිළිබඳ ගැටලු විසඳීම සඳහා රේඛීය අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග කටයුතු කරීම සහ පවතින සියලුම පුරප්පාඩු පිරවීම සඳහා දක්ෂ හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම. |
| සැලසුම්ගත විගණන පරීක්ෂණ සංඛ්‍යාව පැවැත්වීම | • විගණන පරීක්ෂණ වලදී අවධානය යොමු කරන ක්ෂේත්‍ර අඩු කිරීම<br>• විගණන පරීක්ෂණ පැවැත්වීම සඳහා කාලය ඉතිරි කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචන අඩු සංඛ්‍යාවක් සිදු කිරීම | ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පිළිබඳ මනා දැනුමක් ඇති වරලත් ගණකාධිකාරීවරුන් බඳවා ගැනීම සඳහා අදාළ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ පවතින වැටුප් පරිමාණයන් සහ පළපුරුද්ද අවශ්‍යතා පිළිබඳ ගැටලු විසඳීම සඳහා රේඛීය අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග කටයුතු කරීම සහ පවතින සියලුම පුරප්පාඩු පිරවීම සඳහා දක්ෂ හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම. |

## ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර

| ආයතනික කාර්ය සාධනය සම්බන්ධ ගැටළු | සැලසුම් කරන ලද කෙටිකාලීන පියවර | සැලසුම් කරන ලද දිගුකාලීන පියවර |
|---|---|---|
| පළපුරුදු දක්ෂ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ දුෂ්කරතා.<br><br>අනුමත නව සේවක සංඛ්‍යාවවේ පුරප්පාඩු 7කට අමතරව පවතින සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 5ක් පැවතීම | • සැලසුම් සහගත කෙටි කාලීන පියවරක් නොමැත | • දක්ෂ වරලත් ගණකාධිකාරිවරුන් බඳවා ගැනීම සහ රඳවා ගැනීම පිණිස නව වැටුප් ව්‍යුහයක් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම.<br><br>ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ තක්සේරු වාර්තාවේ සහ ගිණුම් හා විගණන සම්බන්ධ ප්‍රමිත සහ කේතයන් පිළිපැදීම සම්බන්ධයෙන් 2015 නිකුත් කළ වාර්තාවේ වෘත්තීය කාර්ය මණ්ඩලය සඳහා වෙළෙඳපල හා බැඳි වැටුප් ව්‍යුහයක් පැවතීමේ අවශ්‍යතාව නිර්දේශ කර ඇත. |
| කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් නොමැතිවීම | එක්සෙල් සහ මයික්‍රොසොෆ්ට් පද්ධති තුළ තොරතුරු නඩත්තු කිරීමේදී නිසි ආරක්ෂක පියවරයන් සහ උපස්ථ විධිවිධාන සමඟ නිවැරදිව නඩත්තු කිරීම. | දැනට ආරම්භ කර ඇති MIS සංවර්ධන ව්‍යාපෘතිය, එම ව්‍යාපෘතියේ උපදේශකයන් ලෙස බඳවාගත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) සමඟ ඉදිරියට කර ගෙන යාම. |
| වැඩිවූ කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල ඉඩකඩ පහසුකම් සැලසීම | අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා 2021 සඳහා අරමුදල් ප්‍රතිපාදන නොමැති වුවද යෝග්‍ය සේවා පරිසරයක් සැපයීම සඳහා මූලික ගෘහ භාණ්ඩ සහ උපාංග මිලදී ගැනීම. | කාර්යාල අවකාශයේ අභ්‍යන්තර සැලසුම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදුකිරීම. |

# කාර්ය්‍යය සාධන ලකුණු පත

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම තම වාර්ෂික කාර්ය සාධනය සැලසුම් කිරීම පිණිස කාර්ය්‍යය සාධන ලකුණු පත්‍රය භාවිතා කරයි. 2020 සැලැස්ම, 2020 තත්‍ය සටහන හා 2021 සඳහා වන සැලැස්ම පහත දක්වා ඇත;

**මූල්‍ය ප්‍රකාශන පරිශීලක දෘෂ්ටිකෝණය:** අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | 2020 සැලැසුම (සංශෝධනය) (සටහන 1) | 2020 තත්‍ය සටහන | | 2021 සැලසුම (සටහන 2) |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලසුමේ % ක් ලෙස | |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන වලින් සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කිරීම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූලතාවය නිශ්චය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන කට්ටල 725 | මූල්‍ය ප්‍රකාශන කට්ටල 732 | 101 | 475 |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණන කාර්යභාරයන් සිදුකර ඇත්ද යන්න පරීක්ෂා කිරීම | විගණන 27 | විගණන 27 | 100 | 33 |

**නියාමනයට භාජනය වූ අස්ථිත්ව දෘෂ්ටිකෝණය** : අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නියාමනයට භාජනය වූ ආයතන අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | 2020 සැලැසුම | 2020 තත්‍ය සටහන | | 2021 සැලසුම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලසුමේ % ක් ලෙස | |
| මූල්‍ය ප්‍රකාශන එක්රැස් කිරීම | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,608 | 1,232 (නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව 1,194) | 77 (සටහන 3) | 1,657* |

* 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සංඛ්‍යාව මත පදනම් වේ.

# කාර්යය සාධන ලකුණු පත

**අභ්‍යන්තර ක්‍රියාවලි දෘෂ්ටිකෝණය:** අපගේ පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීමට අප කුමන අභ්‍යන්තර ක්‍රියාවලියක් සම්බන්ධයෙන් විශිෂ්ටත්වයක් දැක්විය යුතුද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | 2020 සැලැසුම | 2020 තත්‍ය සටහන | | 2021 සැලසුම (සටහන 2) |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලසුමේ % ක් ලෙස | |
| සේවක කාර්‍යය සාධනය | වර්ෂය සඳහා ඉලක්කගත කාර්ය සාධන ලකුණු ළඟාකර ගැනීම | 22,572 | 22,076 (සටහන 4) | 98 | 19,164 |
| දැනුම උසස් කර ගනිමින් වර්තමාන මෙහෙවර ඉලක්කයන් ළඟාකර ගැනීමට ඇති බාධක ඉවත් කිරීම | සතිපතා කෙරෙන ඉගෙනුම් ක්‍රියාකාරකම (අභ්‍යන්තර) | 35 ඉදිරිපත් කිරීම් ප්‍රමිති පිළිබඳ | 37 | 106 | 33 |
| කාලානුරූප ප්‍රතිචාර | ලැබුණු පැමිණිලි, ඉල්ලීම් කරන ලද පැහැදිලි කිරීම් සහ ලැබුණු තොරතුරු පිළිබඳව කටයුතු කිරීම | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5 ක් ඇතුලත | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර දින 5 ක් ඇතුලත | - | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5 ක් ඇතුලත |

### සටහන 1

රටේ පැවති කොවිඩ් 19 වසංගතයේ පළමු වන හා දෙවන රැල්ල පාලනය කිරීමට ගත් පියවරක් වූ සමාජ දුරස්ථභාවය අනුගමනය කරමින් කාර්‍ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්‍ෂාව ගැන අවධානය යොමු කිරීම හේතුවෙන් වැඩ ක්‍රියාවලිය සීමා කිරීමට වීම නිසා 2021 සඳහා වූ මුල් සැලසුම සංශෝධනය කරන ලදි.

### සටහන 2

2021 සඳහා වූ ඉලක්ක දැනට සිටින කාර්‍යය මණ්ඩලයේ ශක්තිය මත පදනම් වී ඇත. සේවයෙන් ඉල්ලා අස්වීම්, ප්‍රසූත නිවාඩු යෑම සහ දැනට පවත්නා පුරප්පාඩු පිරවීමට නොහැකිවීම නිසා සමාලෝචන කටයුතුවල නියුක්ත කාර්‍යය මණ්ඩලය අඩුවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ විගණන කටයුතු කරගෙනයාමට සහ සමාප්ත කිරීමට සිටි කාර්‍යය මණ්ඩලය වර්ෂය තුළ දී හීන විය. කෙසේවුවත්, බඳවාගැනීම් සාර්ථක වූ පසු ඉලක්ක සංශෝධනය කරන ලැබේ.

### සටහන 3

රටේ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් කාර්‍යයාල වසාදැමීම නිසා, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ විගණනය කිරීම ප්‍රමාද වී තිබූ අතර, තැපැල් සේවා යළි ඇරඹීම ප්‍රමාදවීමත් සමග ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ඉදිරි කටයුතු කිරීම කල්දැමීම නිසා ලැබුනු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව අඩුවිය.

### සටහන 4

කාර්‍යය සාධන ලකුණු කාර්‍යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය වැඩයෙහි ස්වභාවය සහ ප්‍රමාණය මත පදනම් වේ.

31 දෙසැම්බර් 2020 දිනට පැවති නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් සංඛ්‍යාව පදනම්ව

## 2020 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ (SBE's) මූල්‍ය ප්‍රකාශන

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 1 | ඒ. බවර් සහ සමාගම (පෞද්) සමාගම | 31 දෙසැම්බර් 2018 |
| 2 | අබාන්ස් එන්වයර්න්මන්ටල් සර්විසස් (පෞද්) සමාගම | 31 දෙසැම්බර් 2018 |
| 3 | අබාන්ස් පොදු සමාගම | 31 මාර්තු 2019 |
| 4 | ඇක්සස් රියැල්ටීස් 2 (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 5 | කොන්ටේනර්ස් (පෞද්) සමාගම ඒස් | 31 මාර්තු 2019 |
| 6 | ඩිස්ට්‍රිපැක්ස් (පෞද්) සමාගම ඒස් | 31 මාර්තු 2019 |
| 7 | එක්ස්පෝර්ට්ස් (පෞද්) සමාගම ඒස් | 31 මාර්තු 2019 |
| 8 | පවර් ඇඹිලිපිටිය (පෞද්) සමාගම ඒස් | 31 මාර්තු 2019 |
| 9 | වින්ඩ් පවර් (පෞද්) සමාගම ඒස් | 31 මාර්තු 2019 |
| 10 | ඉලෙක්ට්‍රික් (පෞද්) සමාගම ඒස් | 31 මාර්තු 2019 |
| 11 | ඇක්යුට් සෙකියුරිටීස් සමාගම | 31 දෙසැම්බර් 2018 |
| 12 | ඇක්යුට් ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 31 දෙසැම්බර් 2019 |
| 13 | ඇඩ්වන්ටිස් ප්‍රොජෙක්ට්ස් ඇන්ඩ් ඉංජිනියරින් (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 14 | ඒ ඊ එන් ෆාම් ඔයිල් ප්‍රොසෙසින් (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 15 | අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම ★ | 31 දෙසැම්බර් 2018 |
| 16 | අහුන්ගල්ල හොලිඩේ රිසෝට්ස් (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 17 | එයාපෝට් ගාඩන් හොටෙල් (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 18 | ඒයිට්කන් ස්පෙන්ස් හොටෙල්ස් ඉන්ටනැෂනල් (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 19 | ඒයිට්කන් ස්පෙන්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට් පොදු සමාගම | 31 මාර්තු 2019 |
| 20 | අක්සෝ නොබෙල් පේන්ට්ස් ලංකා (පෞද්) සමාගම | 31 මාර්තු 2019 |
| 21 | අලියාන්ස් ෆිනෑන්ස් කොම්පැණි පොදු සමාගම | 31 මාර්තු 2019 |
| 22 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 31 දෙසැම්බර් 2019 |
| 23 | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 31 දෙසැම්බර් 2018 |
| 24 | ඇල්ෆා ඇපරල්ස් සමාගම | 31 දෙසැම්බර් 2018 |
| 25 | අමානා කැන්ඩෝ ෂරියා බැලැන්ස්ඩ් ෆන්ඩ් | 31 දෙසැම්බර් 2019 |
| 26 | අමානා කැන්ඩෝ ෂරියා ඉන්කම් ෆන්ඩ් | 31 දෙසැම්බර් 2018 |
| 27 | අමානා තකාෆුල් ලයිෆ් පොදු සමාගම | 31 දෙසැම්බර් 2019 |
| 28 | අමානා තකාෆුල් පොදු සමාගම | 31 දෙසැම්බර් 2019 |
** කොළඹ කොටස් හුවමාරුවේ (CSE) සෝදිසි ලැයිස්තුවේ අතුලත්ය

*** පසුව ලැබීම් (2020 ජනවාරි 31 ට පෙර)

## 2020 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රටේ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පැනවීමේ කටයුතු සඳහා සහය වීමට වාර්ෂික ප්‍රදානයක් ප්‍රතිපාදනය කිරීම මගින්, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමග ඇතිකරගෙන ඇති අතීත වැඩපිළිවෙල අනුව, රුපියල් මිලියන 4 ක ප්‍රදනයක් සැපයීම 2020 වර්ෂය තුළ දී ද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අඛණ්ඩව කරගෙන ගියේය. 1995 අංක 15 දරණ පනතින් පිහිටුවා ඇති ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සහ විගණන ප්‍රමිති කමිටුවේ ක්‍රියාකාරකම් සහ සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම සහ අදාල ගැසට් පත්‍රයේ පල කිරීම ඇතුළු ක්‍රියාකාරකම් වලට සහ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතභාවිතයට ගැනීමට පහසුකම් සැපයීමේ පිරිවැයෙන් කොටසක් පියවා ගැනීමට මෙම අරමුදල් භාවියට ගැනේ. ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිති කමිටුව මසකට වරක් තම රැස්වීම් පවත්වයි. තාක්‍ෂණික ප්‍රකාශයන්ට මහජනයාට ප්‍රවේශය ලබාදෙන සහ ගිණුම්කරණ ප්‍රමිති සහ විගණන ප්‍රමිති වලට සම්බන්ධ සංවර්ධනයන් දැනුවත්වීමට පහසුකම් සපයන එයටම කැපවූ අන්තර්ජාල අඩවියක් ගිණුම්කරණ ප්‍රමිත කමිටුවට සහ විගණන ප්‍රමිති කමිටුවට ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති හා සම්බන්ධයෙන් වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ:

අ) අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද නවතම අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) මත පදනම් වූ ප්‍රමිතවල නවතම තත්වය ඒකාබද්ධ කර 2020 සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංග්‍රහය නිකුත් කිරීම සහ පෙරදී නිකුත් කරන ලද ප්‍රමිත සංග්‍රහයෙහි කළ යුතු වෙනස්කම් පිළිබඳව ගැසට් පත්‍රයෙහි පළ කිරීම.

ආ) අන්තර්ජාතික විගණන සහ තහවුරුකිරීම් ප්‍රමිත මණ්ඩලය (IAASB) විසින් නිකුත් කරන ලද නවතම අන්තර්ජාතික විගණන ප්‍රමිත (ISAs) මත පදනම් වූ ප්‍රමිත වල නවතම තත්වය ඒකාබද්ධ කර SLAuS 540 (සංශෝධිත) ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය සහ අදල හෙළිදරව් කිරීමට වූ වෙනස්කම් ඇතුලත්ව 2020 සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සංග්‍රහය නිකුත් කිරීම සහ පෙර දී නිකුත් කරන ලද ප්‍රමිත සංග්‍රහයෙහි කළ යුතු වෙනස්කම් පිළිබඳව ගැසට් පත්‍රයෙහි පළ කිරීම.

ඇ) භාවිතයට ගෙන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, දැනට පවත්නා පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංශෝධනය කිරීම:

- SLFRS 16 කල්බදු - (කොවිඩ් 19 ට අදල සහන)
- 2021 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භවන මූල්‍ය වර්ෂ සඳහා බලපැවැත්වෙන SLFRS 9, SLFRS 7, LKAS 39, SLFRS 4 සහ SLFRS 16 ට සංශෝධන ඇතුලත් පොලී අනුපාත පිල් ලකුණ ප්‍රතිසංස්කරණ (අවධිය 01 සහ අවධිය 02 )

ඈ) SLFRS 17, රක්ෂණ ගිවිසුම් භාවිතයට ගැනීම සහ 2023 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික වාර්තා කිරීම් කාලපරිච්ඡේ සඳහා බලපැවැත්වෙන බවට, බලපැවැත්වෙන දිනය නිවේදනය කිරීම. තවදුරටත්, SLFRS 17 ට නිකුත්කල සංශෝධන පිළිඹඳ ගැඹුරින් සලකා බැලීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ දී අඛණ්ඩව සිදු වෙමින් පවතී.

ඉ) පහත දැක්වෙන මූල්‍ය වාර්තාකරණ මග පෙන්වීමේ සටහන් සහ විගණන මග පෙන්වීම නිකුත් කිරීම.

- 2020 මාර්තු මාසයේ දි SLFRS 16 කල්බදු පිළිබඳ භාවිතයට මගපෙන්වීමේ සටහන
- කොවිඩ් 19 පැන නැගීම මත ගිණුම්කරණ සලකා බැලීම් පිළිබඳ මග පෙන්වීමේ සටහන් (2020 මැයි 11 දින යාවත්කාලීන කළ)
- කොවිඩ් 19 පැනනැගීම මත ගිණුම්කරණ සලකා බැලීම් පිළිබඳ මගපෙන්වීමේ සටහන් ගැන නිතර අසන ප්‍රශ්ණ (FAQs) (2020 මැයි 11 දින යාවත්කාලීන කල)
- කොවිඩ් 19 වසංගතය විගණනයට සම්බන්ධ කරුණු ගැන මගපෙන්වීමේ සටහන්
- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් නොවන ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය මත පදනම්ව විගණනයන් කරගෙනයාමේදී නිතර අසන ප්‍රශ්ණ (FAQs) සහ ඊට සම්බන්ධ මගපෙන්වීම.

ඊ) පහත දැක්වෙන IFRIC න්‍යායපත්‍ර තීරණ නිකුත් කිරීම:

- IFRS අර්ථකථ කමිටුව විසින් ප්‍රසිද්ධ කරන ලද න්‍යායපත්‍ර තීරණ සම්පාදනය - වෙළුම 1, 2019 ජනවාරි සිට 2019 සැප්තැම්බර්
- IFRS අර්ථකථ කමිටුව විසින් ප්‍රසිද්ධ කරන ලද න්‍යායපත්‍ර තීරණ සම්පාදනය - වෙළුම 2, 2019 ඔක්තෝබර් සිට 2020 මාර්තු

උ) IFRS වර්ෂය තුළ දී භාවිතයට ගත් සහ ගැසට් පත්‍රයෙහි පළ කළ පහත දැක්වෙන දැනට පවතින ශ්‍රී ලංකා විගණන ප්‍රමිති සංශෝධනය කිරීම සහ නව නිළ ප්‍රකාශන නිකුත් කිරීම.

- SLAuS 315 (සංශෝධිත) ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශ හඳුනා ගැනීම සහ තක්සේරුකිරීම 2020

# 2020 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්

අප්‍රේල් මාසයේ දී භාවිතයට ගැනීම.

- සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLSRS) 4400 (සංශෝධිත) එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යය භාර ගැනීම් 2020 දෙසැම්බර් මාසයේ දී භාවිතයට ගැනීම

උ?) අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් නිකුත් කරන ලද පහත දැක්වෙන නිරාවරණ කෙටුම්පත් සහ සාකච්ඡාමය පත්‍රිකා සඳහා ප්‍රතිචාර දැක්වීම සහ විචාරාත්මකව සාකච්ඡා කිරීම;

- ED/2020/2 - කොවිඩ් 19 සම්බන්ධිත ගෙවල්කුලී සහන
- ED/2019/7 - පොදු ඉදිරිපත් කිරීම සහ හෙළිදරව්කිරීම
- කුඩා ව්‍යාපාර සඳහා වන ප්‍රමිතිය (IFRS for SMEs) විස්තීර්ණ විමර්ෂණයට විචාර දැක්වීම
- ව්‍යාපාර සංයෝජන - හෙළිදරව් කිරීම්, කීර්තානාමය සහ හානිකරණය පිළිබඳ සාකච්ඡාමය පත්‍රිකාව ගැන විචාර දැක්වීම

එ) බැංකු සහ රක්ෂණ වැනි විවිධ කර්මාන්ත ආවරණය වන උනන්දු පාර්ශවයන් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත ක්‍රියාත්මක කිරීමේ සහ අර්ථකථනය කිරීමේ ගැටළු පිළිබඳ අඛණ්ඩව විචාරාත්මක සාකච්ඡා කිරීම.

ඒ) අන්තර්ජාතික විගණන සහ තහවුරු ප්‍රමිත මණ්ඩලය (IAASB) විසින් නිකුත් කරන නිරාවරණ කෙටුම්පත් සහ සාකච්ඡාමය පත්‍රිකා සඳහා විචාර ඉදිරිපත් කිරීම;

- යෝජිත ISA 600 (සංශෝධිත): විශේෂ සලකා බැලීම් - සමූහ මූල්‍ය ප්‍රකාශන විගණනය (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුලත්ව) පිළිබඳ නිරාවරණ කෙටුම්පත සහ,
- මූල්‍ය ප්‍රකාශන විගණනයක දී වංචාව සහ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සාකච්ඡාමය පත්‍රිකාව සහ ගුණාත්මය කළමණාකරණ ප්‍රමිති සඳහා ක්‍රියාත්මකකිරීමේ සැලසුම්

ඔ) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳපොළ (CSE) සමග උපදේශනය සහිතව විගණන ප්‍රමිති කමිටුව විගණකවරුන්ට මගපෙන්වීම සැපයීමේ අරමුණ ඇතිව වෙනස් කල විගණන වාර්තාවක් නිකුත් කල පසු තම සේවාදයකයින් විසින් ගෙන ඇති ක්‍රියාකාරකම් පිළිඹඳව කොළඹ කොටස් වෙළඳපොළට සංනිවේදනය කිරීමේ නියැදි වාර්තා ආකෘතියක් නිකුත්කොට ඇත.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/B/SLAASMB/1/20/39 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 30 November 2021

සභාපති
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලාභ හා අලාභ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ස) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ නිශ්චිත වෙළඳ ව්‍යාපාර විසින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව සමීක්ෂණය කිරීමයි. 2020 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් සමස්ත නිශ්චිත වෙළඳ ව්‍යාපාර සංඛ්‍යාව 1,657 කි. කෙසේවෙතත්, 2020 වර්ෂය තුළ දී ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 394ක් ද ඇතුලුව මූල්‍ය ප්‍රකාශන 1,232ක් මණ්ඩලය වෙත ලැබී තිබුණි.

(ආ) 2020 වර්ෂය තුළ ඉහත පරිදි ලැබී තිබුණු මූල්‍ය ප්‍රකාශන අතුරෙන් මූල්‍ය ප්‍රකාශන 732 ක් පමණක් සමාලෝචනය කර තිබූ අතර එහි ප්‍රගතිය 59%ක් විය. කෙසේ වෙතත්, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අතරින් 619 ක් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ 2% ක් පමණ ආවරණයක් දක්වමින් හඳුනාගන්නා ලද මුළු නිශ්චිත වෙළඳ ව්‍යාපාර සංඛ්‍යාවෙන් ව්‍යාපාර 27 ක් සම්බන්ධයෙන් පමණක් විගණන පරීක්ෂණ සිදුකර තිබුණි. මෙමගින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීමක් නිරීක්ෂනය විය.

(ඈ) මණ්ඩලයේ කටයුතු ඵලදායී ලෙස ඉටුකරනු පිණිස 2015 වර්ෂයේ සිට මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබූ නමුත් 2021 වර්ෂය වන තුරුත් එම පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව 17 කි. මේ අතරින් පුරප්පාඩු 13ක් විධායක මට්ටමේ තනතුරුවලට අදාළ පුරප්පාඩු විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

| **2021 නොවැ. 30 දිනැති විගණන වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණ** | **කළමනාකරණයේ ප්‍රතිචාර** |
|---|---|
| **2.3 වගන්තිය** | |
| **වෙනත් කරුණු** | |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1657ක් හඳුනාගෙන ඇති අවස්ථාවේ 2020 වර්ෂය තුළ දී, පෙර වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන 394 ක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන 1,232 ක් මණ්ඩලයට ලැබී තිබුණි. | 1995 අංක 15 දරන පනතින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශ්‍රි.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු කාලසීමාවක් නිශ්චිතව සඳහන් කර නොමැත. 2021 මැයි 19 දිනැති විගණකාධිපතිවරයාගේ මූලික විමසුම සඳහා අපගේ සවිස්තරාත්මක ප්‍රතිචාරයේ පැහැදිලි කළ පරිදි, 2020 තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීම සඳහා ශ්‍රි.ල.ගි.වි.ප්‍ර.ස.ම හැකි සෑම ප්‍රයත්නයක් ම දරා ඇත.<br><br>ඒ අනුව, නිශ්චිත කාලයක් තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ට නියම කිරීම ශ්‍රි.ල.ගි.වි.ප්‍ර.ස.ම පාලනයෙන් ඔබ්බට ගිය කරුණකි. කෙසේ වෙතත්, සංශෝධනය වෙමින් පවතින නව පනත මගින් මෙම ගැටළුව පිළිබඳ අවධානය යොමු කර ඇත.<br><br>කෙසේ වෙතත් කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රතිචාර අනුමත කරන ලද විගණන කමිටු රැස්වීමේ දී සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද විගණන වාර්තාවේ කෙටුම්පතෙහි මෙම කරුණ ඇතුළත් කර නොතිබුණ බව අවධාරණය කිරීමට කැමැත්තෙමු. |
| (ආ) (i) 2020 වර්ෂය තුළ ලැබුණු ඉහත මූල්‍ය ප්‍රකාශනවලින් මණ්ඩලය විසින් සමාලෝචනය කර තිබුණේ 59% ක ප්‍රමාණයක් හෙවත් මූල්‍ය ප්‍රකාශන 732ක් පමණි. | 2021 මැයි 19 දිනැති විගණකාධිපතිවරයාගේ මූලික විමසුම සඳහා අපගේ සවිස්තරාත්මක ප්‍රතිචාරයේ පැහැදිලි කළ පරිදි, ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිබඳ සමීක්ෂණය කිරීමේ වගකීම මණ්ඩලයට පැවරී ඇති අතර ඒ අනුව, නියාමන යාන්ත්‍රණය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරනුවස් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කළ යුතු ආකාරය සහ වාර්ෂිකව සමාලෝචනය කළ යුතු කුඩා ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව තීරණය කිරීමට මණ්ඩලයට හැකිය.<br><br>ශ්‍රි.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් පවත්නා කාර්ය මණ්ඩලයෙන් උපරිම සේවාවක් ලබා ගැනීම මෙන්ම මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය උපරිම කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස වාර්ෂිකව ඉහළ අවදානම් සහිත කුඩා පරිමාණ ව්‍යපාර ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ වසර 3-5 ක චක්‍රයක් තුළ අනෙකුත් අඩු අවදානම් ආයතන පිළිබඳ සමාලෝචනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.<br><br>ඒ අනුව, එකී ආවරණ සම්මිශ්‍රණය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචන 732 ක් සිදුකරමින් කාර්ය මණ්ඩලය වෙත 2020 වර්ෂය සඳහා ලබා දී ඇති ඉලක්ක 100% ක් සපුරා ගෙන ඇත.<br><br>කෙසේ වෙතත්, 2020 වසර පුරාවට තාක්ෂණික කාර්ය මණ්ඩල පුරප්පාඩු ගණනාවක් පුරවා නොතිබීම හේතුවෙන් ඇති වූ අඩු කාර්ය මණ්ඩල ප්‍රමාණය හේතුවෙන් සමාලෝචන ආවරණ ප්‍රමාණය අඩුවිය.<br><br>තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් සෑම වසරකම කුඩා ව්‍යාපාර ව්‍යවසායයන්හි 100% ක සමාලෝචන ඉලක්ක කිරීම හොඳම භාවිතයක් නොවන බැවින්, 2021 සිට ක්‍රියාත්මක වන පරිදි, ඉන් ඉවත් වීමට හේතු 2021 අප්‍රේල් 30 වැනි දින අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ පැවති රැස්වීමේදී සහ ශ්‍රි.ල.ගි.වි.ප්‍ර.ස.ම හි ඉහත කී වෙනස් වූ ක්‍රියාවලිය පැහැදිලි කරන ලද සභාපතිනියගේ 2021 ජුනි 12 දිනැති ලිපිය මගින් විගණකාධිපතිවරයාට පැහැදිලි කර ඇත.<br><br>කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රතිචාර අනුමත කරන ලද විගණන කමිටු රැස්වීමේදී සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද විගණන වාර්තාවේ කෙටුම්පතෙහි මෙම කරුණ ඇතුළත් කර නොතිබුණ බව අවධාරණය කිරීමට කැමැත්තෙමු. |

# විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

| 2021 නොවැ. 30 දිනැති විගණන වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර |
|---|---|
| (ii) පෙර වසරවලට අදාළව සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය ප්‍රකාශන 619. | පසුගිය වසරවලට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉහළ ප්‍රතිශතයක් සමාලෝචනය කිරීම සඳහා වසර පුරාවට සමානව ව්‍යාප්ත වූ අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස වසර තුළ සිදු කෙරෙන සමාලෝචන ප්‍රධාන වශයෙන් ඉවහල් වූ අතර කුඩා පරිමාණ ව්‍යාපාර ව්‍යවසායන් විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කැලැන්ඩර වර්ෂයේ අවසාන භාගයේ දී සිදුවේ. සාමාන්‍යයෙන් බොහෝ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ තම මූල්‍ය වර්ෂය අවසාන වී මාස 6 කට පමණ පසුව වන අතර එමඟින් මණ්ඩලය විසින් වසරේ මුල් භාගයේ දී, පෙර වසරට අදාළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කිරීමේ නැඹුරුවක් ඇත. මෙය මෙහෙයුම් ක්‍රියාවලියක් බැවින්, නවතම මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට බලා සිටීම සහ එම වසරේදී ම එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම ප්‍රායෝගික නොවේ.<br><br>නිරීක්ෂණ කෙටුම්පතේ සඳහන් ප්‍රතිචාරවල පැහැදිලි කර ඇති පරිදි මෙය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ පාලනයෙන් ඔබ්බට ගිය කරුණක් වන අතර ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්ය සාධනය මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස සැලකිය නොහැකිය.<br><br>කෙසේ වෙතත් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත මූල්‍ය ප්‍රකාශන ලැබුණු මොහොතේ සිට කාර්ය මණ්ඩලය විසින් සමාලෝචනයක් සම්පූර්ණ කිරීමට ගතවන කාලය මැනීම කෙරෙහි අවධානය යොමු කිරීම කාර්ය සාධනය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වනු ඇත. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගත් මුළු නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් 2% ආවරණය වන පරිදි විගණන පරීක්ෂණ 27ක් පමණක් සිදු කර ඇත. මෙමගින් පසුගිය වසරේ සිදු කරන ලද පරීක්ෂණ 45 ට සාපේක්ෂව පරීක්ෂණවල ක්‍රමානුකූල අඩුවීමක් නිරීක්ෂණය විය. | අවදානම් පාදක ආයතන සහ ඒවායේ විගණනය සහ එවැනි ආයතනවල අනනුකූලවීම්වල බලපෑම් සහ සහ ආර්ථිකය පිළිබඳ විගණන කෙරෙහි අවධානය යොමු කළ යුතු බැවින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණවල වඩාත් යෝග්‍ය ආවරණය සමඟ සම්බන්ධ වූ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්ය සාධනය, සමාලෝචන හෝ පරීක්ෂණ සංඛ්‍යාවට සම්බන්ධ කළ නොහැක. නියාමන යාන්ත්‍රණයෙන් හොඳම ප්‍රතිඵල ලබා ගැනීමට, වඩාත් සුදුසු මූල්‍ය ප්‍රකාශන සහ විගණන සමාලෝචනය කිරීම හෝ පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. මෙම අවධානය සහ එහි වැදගත්කම 2021 මැයි 19 දිනැති විගණකාධිපතිවරයාගේ මූලික විමසුමට අප විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිචාරයෙන් මෙන්ම පූර්ව විගණන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද සියලු ප්‍රතිචාරවල දී ද පැහැදිලි කර ඇත. තවද, නියාමන ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා පවත්නා අඩු කාර්ය මණ්ඩල සංඛ්‍යාව මගින් මෙම ආවරණය සිදු වන අතර එවැනි අවස්ථාවන් හි දී, සීමිත සම්පත් උපරිම ලෙස යොදා ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වඩාත් සුදුසු ආවරණය තීරණය කරයි. කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රතිචාර අනුමත කරන ලද විගණන කමිටු රැස්වීමේදී සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද විගණන වාර්තාවේ කෙටුම්පතෙහි මෙම කරුණ ඇතුළත් කර නොතිබුණ බව අවධාරණය කිරීමට කැමැත්තෙමු. |
| (ඈ) මණ්ඩලයේ සමීක්ෂණ කටයුතු ඵලදායී ලෙස සිදු කිරීම සඳහා 2015 වසරේ සිට මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ නමුත් 2021 වනතුරුත් එම ක්‍රමය ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණකාධිපතිවරයා වෙත බොහෝ වාරයක් දන්වා ඇති පරිදි, 2015 දී කළමනාකරණ තොරතුරු පද්ධතියක සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමේ ප්‍රමාදය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් සිදු කරන ලද අතර එය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ පාලනයෙන් ඔබ්බට ගිය කරුණකි. කෙසේ වෙතත්, 2021 දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම MIS සංවර්ධනය කිරීම සඳහා ආයතනයක් සම්බන්ධ කරගැනීම ආරම්භ කළ අතර නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු MIS සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග සංවර්ධක Innova IT Systems (Pvt) Ltd සමඟ ගිවිසුම් ගතවීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට හැකි විය. මේ වනවිට MIS ව්‍යාපෘතිය පද්ධතියේ සංවර්ධනයේ 2 වන අදියරට පැමිණ ඇත.<br><br>නිරීක්ෂණ කෙටුම්පතේ ප්‍රතිචාරවල ද මෙම කාරණය පැහැදිලි කර ඇත. |

# විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

| 2021 නොවැ. 30 දිනැති විගණන වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර |
|---|---|
| (ඉ) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 17ක් පැවතිනි. මෙම පුරප්පාඩු අතරින් පුරප්පාඩු 13 ක් විධායක මට්ටමේ තනතුරුවලට අදාළව විය. | දැනට පවතින වැටුප්වලට අනුව වෘත්තීයමය වශයෙන් දක්ෂ කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරන්තර අවධානයට ලක්ව ඇත. මණ්ඩලය විසින් දරන ලද උත්සාහයන් කිහිපයක ප්‍රතිඵලය මත 2021 දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ වෘත්තීය කාර්ය මණ්ඩලය සඳහා සංශෝධිත වැටුප් පරිමාණයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට මණ්ඩලය සමත් විය. මේවන විට, සංශෝධිත වැටුප් පරිමාණයන් මත පදනම්ව දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවැති දක්ෂ වෘත්තීය කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අපේක්ෂාවෙන් සිටී.<br><br>නිරීක්ෂණ කෙටුම්පතේ ප්‍රතිචාරවල ද මෙම කාරණය පැහැදිලි කර ඇත. කෙසේ වෙතත්, මුදල් හා පරිපාලන විධායක නිලධාරී තනතුර 2021 ජූලි මාසයේ දී එය පුරවන ලදී. |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දිනට | සටහන | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | 9,345,772 | 11,318,497 |
| තැන්පතු | 4 | 6,979,736 | 6,979,736 |
| | | 16,325,508 | 18,298,233 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 5 | 783,811 | 642,810 |
| ලැබිය යුතු දෑ | 6 | 3,651,614 | 3,899,093 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 7 | 8,468,634 | 1,128,025 |
| | | 12,904,059 | 5,669,928 |
| **මුළු වත්කම්** | | 29,229,567 | 23,968,161 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 8 | 13,639,060 | 16,259,927 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 9 | 2,686,448 | 2,038,306 |
| | | 16,325,508 | 18,298,233 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 10 | 9,644,531 | 922,064 |
| ගෙවිය යුතු දෑ | 11 | 3,259,528 | 4,747,864 |
| | | 12,904,059 | 5,669,928 |
| **මුළු වගකීම්** | | 29,229,567 | 23,968,161 |

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ වගකීමකි.

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති

සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(මූල්‍ය හා පරිපාලන)

දිනය - 2021 පෙබරවාරි 2

# මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 12 | 69,159,150 | 82,511,881 |
| අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිදහස්කල ප්‍රදාන | | 4,000,000 | 4,000,000 |
| | | 65,159,150 | 78,511,881 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා | | (1,252,500) | (1,327,500) |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 13 | (240,100) | (240,100) |
| කාර්ය මණ්ඩල පිරිවැය | 14 | (36,922,897) | (41,487,633) |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | (1,656,830) | (1,544,609) |
| පුවත්පත් නිවේදන | | (256,311) | (897,161) |
| කුලී හා ගොඩනැගිලි සේවා ගාස්තු | | (10,061,219) | (11,871,631) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 3 | (3,078,182) | (3,141,970) |
| විදුලිය | | (939,094) | (1,214,982) |
| සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු | | (1,663,000) | (1,879,000) |
| අන්තර්ජාතික සාමාජිකත්වයන් | | (2,420,339) | (2,240,195) |
| පොත් හා වාර සඟරා | | (1,059,394) | (944,722) |
| ජාත්‍යන්තර ගමන් | | (31,150) | (4,990,384) |
| පුහුණුව හා සංවර්ධනය | | (183,275) | (717,362) |
| බලපත්‍ර හා රක්ෂණ | | (998,698) | (1,081,768) |
| ලිපි ද්‍රව්‍ය | | (766,986) | (853,151) |
| වෙනත් පරිපාලන වියදම් | 15 | (3,629,175) | (4,079,713) |
| | | - | - |
| **වෙනත් විස්තීර්ණ අදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය / (පාඩුව) | | (1,674,720) | (648,735) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාල රජයේ ප්‍රදාන | | 1,674,720 | 648,735 |
| | | - | - |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්ත/(හිඟය)** | | - | - |

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල<br>රු. |
|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | - |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | - |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** |

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | | - | - |
| ගැලපීම්; | | | |
| වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන | | 76,935,470 | 81,689,370 |
| මුළු විස්තීර්ණ ආදායම්වලට මාරුකල විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 12 | (70,833,870) | (83,160,616) |
| ක්ෂය වීම් | 3 | 3,078,182 | 3,141,970 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | | 14 | - |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනයෙන් ලද පොළිය | | (307,160) | (338,870) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 14.1 | 2,648,142 | 1,350,531 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර | | | |
| වියදමට වැඩි ආදායම/ (ආදායමට වැඩි වියදම) | | 11,520,778 | 2,682,385 |
| තොග (වැඩිවීම)/ අඩුවීම | | (141,001) | 55,705 |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/ අඩුවීම | | 247,479 | (870,004) |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම) | | (1,488,336) | (550,769) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 10,138,920 | 1,317,317 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (1,105,471) | (67,490) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | | (2,000,000) | (500,000) |
| පාරිතෝෂික අරමුදල්/ආරක්ෂිත සේප්පුවේ ආයෝජනයෙන් ලද පොළිය | | 307,160 | 338,870 |
| ශුද්ධ මුදල් ප්‍රවාහ | | 7,340,609 | 1,088,697 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | - | - |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 7,340,609 | 1,088,697 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,128,025 | 39,328 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | 7 | 8,468,634 | 1,128,025 |

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සම්ක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම 2021 පෙබරවාරි මස 2 වැනි දින මණ්ඩලයේ සාමාජිකයින්ගේ යෝජනාවලියකින් අනුමත කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සම්ක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. 2020 දෙසැම්බර් 31 දිනට ස්ථිර පදනම මත සේවකයින් 14 දෙනෙකු, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 3 දෙනෙකු හා තාවකාලික පදනම මත සේවකයින් 1 කෙනෙකු මණ්ඩලය විසින් සේවයේ යොදවා තිබිනි. (2019 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයින් 13 ක්, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 3 ක් සහ තාවකාලික පදනම මත සේවකයින් 1 කෙනෙකු විය.)

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය මත පදනම්ව ගිණුම් සැකසීම සඳහා වූ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සකස් කෙරේ. මූල්‍ය ප්‍රකාශන, අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන පිළියෙල කරන අතර ගිණුම් ප්‍රතිපත්ති කාලපරිච්ඡේදය පුරාම යථානුරූපීව භාවිතයට ගනු ලැබේ.

### වාර්තාකරන දිනයෙන් පසු සිදු වූ සිද්ධීන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් සලකා බලන අතර අවශ්‍ය වන පරිදි යෝග්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කෙරේ.

### දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට දක්වනු ලැබේ. වත්කම් වල තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සරල රේඛීය ක්‍රමය අනුව ක්ෂයවීම් ගණනය කොට මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයට අය කෙරේ.

| විස්තරය | තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවිත කාලය |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 10 |
| කාර්යාල උපකරණ | වර්ෂ 4 |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | වර්ෂ 6-10 |
| පොත්පත් හා ප්‍රකාශන | වර්ෂ 3 |

මිලට ගත් මාසයේදී පූර්ණ ක්ෂය ගණනය කරන නමුත් විකුණන මාසයට ක්ෂය ගණනය නොකර, මිලදී ගත් වර්ෂයේදී හා විකුණන ලද වර්ෂයේදී පාවිච්චි කරන ලද කාලය මත පදනම්ව ක්ෂය ප්‍රතිපාදනය කෙරේ.

පොත්පත් හා සඟරා හැර වටිනාකම රු.7,500/- ට අඩු සියළුම අයිතමයන්, ගිණුම්කරණ ප්‍රමිති, විගණන ප්‍රමිති හා වටිනාකම රු. 1,000/- ට වැඩි නොවන අනෙකුත් ප්‍රකාශන, මිලට ගත් වර්ෂයේ වියදමක් ලෙස සලකනු ලැබේ.

### තොග

තොග අගය කරන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් අඩු අගයට ය. තොග පිරිවැය තීරණය කරන්නේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ (FIFO) පදනම අනුවය.

### ලැබිය යුතු දෑ

සියළුම ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තුගත අගයට දක්වන අතර, අවශ්‍ය වන පරිදි මූල්‍ය ප්‍රකාශන වල බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම් කරනු ලැබේ.

### මුදල් හා මුදල් සමාන දෑ

බැංකුවේ සහ අතැති මුදල් සහ කෙටිකාලීන තැන්පතු, ඒවායේ පිරිවැයට දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් බැංකු අයිරා හිලව් කිරීමෙනි.

### ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ සඳහා වගකීම්, ගෙවීමට බලාපොරොත්තු වන මුදල් සහ මුදල් හා සමාන දෑ වල වටිනාකම දැක්වේ.

### නිශ්චිත  ප්‍රතිලාභ පිරිවැය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වූ නිශ්චිත  ප්‍රතිලාභ වගකීම,නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගයට පෙන්නුම් කරයි.

සියලු ආයුගණක ලාභයන් සහ අලාභයන් මූල්‍ය කාර්ය සාධනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගැනේ.

### රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලද රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනා ගන්නේ අදාළ වියදම හඳුනාගනු ලබන කාලපරිච්ඡේදයේදීම ය.

ඉදිරි කාලපරිච්ඡේදයන් තුළ වියදමක් වන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම් වලින් වගකීම් (ලැබුණු රාජ්‍ය ප්‍රදානවලට අදාළ වගකීම් හැර) අඩු කළ විට නියෝජනය වන රාජ්‍ය ප්‍රදාන වගකීම් ලෙස හඳුනාගනු  ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 3. දේපළ, පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | | කාර්යාල උපකරණ | | ලී බඩු සහ සවිකිරීම් | | පුස්තකාල පොත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිනට | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. |
| පිරිවැය | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 51,160,000 | 51,160,000 | 12,400,701 | 12,333,211 | 11,420,413 | 11,420,413 | 3,198,399 | 3,198,399 | 78,179,513 | 78,112,023 |
| එකතු කිරීම් | - | - | 308,613 | 67,490 | 796,858 | - | - | - | 1,105,471 | 67,490 |
| ඉවත් කිරීම් | - | - | (1,253,257) | - | - | - | - | - | (1,253,257) | - |
| වර්ෂය අවසානයේ ශේෂය | 51,160,000 | 51,160,000 | 11,456,057 | 12,400,701 | 12,217,271 | 11,420,413 | 3,198,399 | 3,198,399 | 78,031,727 | 78,179,513 |
| සමුච්චිත ක්ෂය ශේෂය | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 42,075,936 | 40,474,665 | 10,791,042 | 9,539,015 | 10,797,192 | 10,517,081 | 3,196,846 | 3,188,285 | 66,861,016 | 63,719,046 |
| වර්ෂය සඳහා ක්ෂයවීම් | 1,601,271 | 1,601,271 | 1,084,581 | 1,252,027 | 391,250 | 280,111 | 1,080 | 8,561 | 3,078,182 | 3,141,970 |
| ඉවත් කිරීම් මත ක්ෂයවීම් | - | - | (1,253,243) | - | - | - | - | - | (1,253,243) | - |
| වර්ෂය අවසානයේ ශේෂය | 43,677,207 | 42,075,936 | 10,622,380 | 10,791,042 | 11,188,442 | 10,797,192 | 3,197,926 | 3,196,846 | 68,685,955 | 66,861,016 |
| වර්ෂය අවසානයේ ශේෂය ලියා අඩු කළ අගය | 7,482,793 | 9,084,064 | 833,677 | 1,609,659 | 1,028,829 | 623,221 | 473 | 1,553 | 9,345,772 | 11,318,497 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 31-දෙසැ-20<br>රු. | 31-දෙසැ-19<br>රු. |
|---|---|---|
| **4. තැන්පතු (ජංගම නොවන)** | | |
| කුලී තැන්පතු | 6,879,736 | 6,879,736 |
| ආරක්ෂක සේප්පු තැන්පතු | 100,000 | 100,000 |
| | 6,979,736 | 6,979,736 |
| **5. තොග** | | |
| ලිපි ද්‍රව්‍ය | 783,811 | 642,810 |
| **6. ලැබිය යුතු දෑ** | | |
| ඉදිරියට කළ ගෙවීම් | 2,252,315 | 2,499,794 |
| කාර්‍යයාල පරිශ්‍රයේ අභ්‍යන්තර ඉදිකිරීම් සඳහා උපදේශකවරයාට කොටස් වශයෙන් ගෙවීම් | 1,369,299 | 1,369,299 |
| තැන්පතු | 30,000 | 30,000 |
| | 3,651,614 | 3,899,093 |
| **7. මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ සහ අතැති මුදල් | 8,468,634 | 1,128,025 |
| | 8,468,634 | 1,128,025 |
| **8. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රධාන (ජංගම නොවන)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 16,259,927 | 20,184,938 |
| ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා ලැබුණු හා වැයකල ප්‍රදාන | 1,105,471 | 67,490 |
| පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කල ලැබුණු ප්‍රදාන | 2,000,000 | 500,000 |
| වර්ෂය සඳහා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | (3,078,182) | (3,141,970) |
| පාරිතෝෂික අරමුදලෙන් ලැබූ පොළිය | 307,160 | 338,870 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | (14) | - |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්ෂය සඳහා වෙනස්වීම | (2,955,302) | (1,689,401) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 13,639,060 | 16,259,927 |
| **නියෝජනය වන්නේ** | | |
| දේපළ පිරියත හා උපකරණ | 9,345,772 | 11,318,497 |
| තැන්පතු (ජංගම නොවන) | 6,979,736 | 6,979,736 |
| (පාරිතෝෂික වෙන්කිරීම්)/ පාරිතෝෂික අරමුදලේ අතිරික්තය | (2,686,448) | (2,038,306) |
| වර්ෂය අවසානයේ ශේෂය | 13,639,060 | 16,259,927 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. |
|---|---|---|
| **9. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් / වත්කම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 6,340,193 | 5,047,793 |
| වර්ෂය තුළ ප්‍රතිපාදන | 836,135 | 576,197 |
| වර්ෂය තුළ ලැබුණු පොළිය | 444,447 | 464,469 |
| ආයුගණක ලාභ/පාඩු | 1,674,720 | 648,735 |
| | 9,295,495 | 6,737,194 |
| වර්ෂය තුළ ගෙවීම් | - | (397,001) |
| | 9,295,495 | 6,340,193 |
| පාරිතෝෂික අරමුදල (සටහන් 9.1) | (6,609,047) | (4,301,887) |
| වර්ෂය අවසානයේ ශේෂය | 2,686,448 | 2,038,306 |

ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත.

| | | |
|---|---|---|
| අපේක්ෂිත වේතන වැඩිවීම | 10% | 10% |
| වට්ටම්/පොලී අනුපාතය | 7.01% | 10.23% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 9% | 9% |

පාරිතෝෂික සඳහා වගකීම ආංශිකව බාහිර අරමුදල් මගින් සම්පාදනය වී ඇත.

| | | |
|---|---|---|
| **9.1 පාරිතෝෂික අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 4,301,887 | 4,022,968 |
| වර්ෂය තුළ සිදුකරන ලද ආයෝජන | 2,000,000 | 500,000 |
| වර්ෂය තුළ ලැබුණු පොළිය | 307,160 | 338,870 |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | - | (559,951) |
| වර්ෂය අවසානයේ ශේෂය | 6,609,047 | 4,301,887 |
| **10. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රධාන (ජංගම)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 922,064 | (1,531,701) |
| තොග සහ ලැබිය යුතු දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | (106,478) | 814,300 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | 7,340,609 | 1,088,697 |
| විලම්බිත ආදායම් සහ ගෙවිය යුතු දෑ වල (වැඩිවීම්)/අඩුවීම් | 1,488,336 | 550,768 |
| වර්ෂය අවසානයේ ශේෂය | 9,644,531 | 922,064 |
| **නියෝජනය වන්නේ** | | |
| තොග | 783,811 | 642,810 |
| ලැබිය යුතු දෑ | 3,651,614 | 3,899,093 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 8,468,634 | 1,128,025 |
| ගෙවිය යුතු දෑ | (3,259,528) | (4,747,864) |
| වර්ෂය අවසානයේ ශේෂය | 9,644,531 | 922,064 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 31-දෙසැ-20<br>රු. | 31-දෙසැ-19<br>රු. |
|---|---|---|
| **11. ගෙවිය යුතු දෑ** | | |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 417,100 | 560,100 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන | 1,000,000 | 2,000,000 |
| සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු | 300,000 | 567,000 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා | 754,000 | 754,000 |
| වෙනත් ගෙවිය දෑ | 788,428 | 866,764 |
| | 3,259,528 | 4,747,864 |

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 31-Dec-20<br>Rs. | 31-Dec-19<br>Rs. |
|---|---|---|
| **12. රාජ්‍ය ප්‍රදාන** | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | 76,935,470 | 81,689,370 |
| පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කල ලැබුණු ප්‍රදාන | (2,000,000) | (500,000) |
| ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවූ ප්‍රදාන | (1,105,471) | (67,490) |
| ශුද්ධ ජංගම වත්කම් සඳහා වැය කල ප්‍රදාන | (8,722,467) | (2,453,765) |
| වර්ෂය සඳහා ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 3,078,182 | 3,141,970 |
| පාරිතෝෂික අරමුදලින් ලැබු පොළිය | (307,160) | (338,870) |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | 14 | - |
| වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 1,280,582 | 1,040,666 |
| මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන ප්‍රදාන | 69,159,150 | 82,511,881 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් තුල දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීම සම්බන්ධ ප්‍රදාන | 1,674,720 | 648,735 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන මුළු විස්තීර්ණ ආදායම්වලට මාරු කරන ලද මුළු ප්‍රදානයන් | 70,833,870 | 83,160,616 |
| **13. විගණකවරුන්ගේ පාරිශ්‍රමික** | | |
| ජංගම වර්ෂයේ වියදම් | 240,100 | 200,000 |
| පසුගිය වසරේ (අධි)/ ඌන වෙන් කිරීම් | - | 40,100 |
| | 240,100 | 240,100 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දෙසැම්බර් 31 වන දිනට | 31-දෙසැ-20 රු. | 31-දෙසැ-19 රු. |
|---|---|---|
| **14. කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල පාරිශ්‍රමික | 19,258,631 | 20,442,737 |
| සේවක අර්ථසාධක අරමුදල් | 2,452,919 | 2,602,828 |
| සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් | 613,230 | 651,615 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් (සටහන 14.1) | 973,422 | 701,796 |
| වෙනත් බාහිරින් ලබා ගත් සේවා සඳහා ගෙවීම් | 727,607 | 1,401,215 |
| කාර්ය මණ්ඩල දිරි දීමනා | 9,048,000 | 10,473,666 |
| වෛද්‍ය රක්ෂණය | 517,434 | 654,872 |
| කාර්ය මණ්ඩල ශුභසාධනය | 672,446 | 956,547 |
| වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 2,659,208 | 3,602,357 |
| | 36,922,897 | 41,487,633 |
| **14.1 නිශ්චිත ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය සඳහා ගාස්තු | 836,135 | 576,197 |
| වර්ෂය සඳහා ශුද්ධ පොළිය | 137,287 | 125,599 |
| | 973,422 | 701,796 |
| වෙනත් විස්තීර්ණ අදායම් ලෙස හෙළිදරව්කල ආයුඝණක ලාභ/අලාභ | 1,674,720 | 648,735 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි හෙළිදරව් කල නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 2,648,142 | 1,350,531 |
| **15. වෙනත් පරිපාලන වියදම්** | | |
| වාර්ෂික වාර්තා | 412,512 | 430,000 |
| පරිඝණක නඩත්තු වියදම් | 160,558 | 79,494 |
| උපකරණ නඩත්තු වියදම් | 333,255 | 331,360 |
| සංනිවේදන වියදම් | 831,077 | 901,633 |
| වාහන නඩත්තු වියදම් | 846,727 | 959,409 |
| වාහන ගාල් කිරීමේ වියදම් | 291,223 | 203,226 |
| කාර්යාල වියදම් | 265,660 | 462,399 |
| නෛතික හා වෘත්තියවේදී ගාස්තු | 112,800 | 220,500 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | 174,700 | 193,100 |
| ලී බඩු, සවිකිරීම් සහ උපකරණ රක්ෂණය | 136,379 | 151,671 |
| විවිධ වියදම් | 64,284 | 146,921 |
| | 3,629,175 | 4,079,713 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 16. ප්‍රාග්ධන වගකීම් වලට බැඳීම්

16.1 කාර්‍යයන් පුළුල් කිරීම සඳහා කුලියට ගෙන ඇති ගොඩනැගිල්ලේ පළමු මහලේ කාමර වෙන් කිරීමට අදාළ නිර්මාණ හා ඉදිකිරීම් කටයුතු සහ තෙවන මහලේ අවශ්‍ය පුළුල් කිරීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට මණ්ඩලය අවසර දී තිබිණ. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දිනට එම කාර්‍යයන් සම්බන්ධ මූල්‍ය බැඳීම්වලට එළඹ නොතිබිණ. (2019 දෙසැම්බර් 31 දින වනවිට - කිසිවක් නොතිබිණ).

16.2 ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කිරීමට, සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අනුමත කර තිබේ. ඒ සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මෘදුකාංග විකුණුම්කරුවකු තෝරා ගැනීම සඳහා සහාය වීම ඇතුළුව කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) නිර්මාණය කිරීමට, සංවර්ධනය කිරීමට අදාළ සහ ක්‍රියාත්මක කිරීමට උපදේශාත්මක සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) පත්කර ICTA සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. තවද, එකී සේවා සඳහා උපදේශක ගාස්තු ලෙස රු. 2,670,000 ක් ගෙවීමට එකඟ වී ඇත. (2019 දෙසැම්බර් 31 දින වනවිට - කිසිවක් නොතිබිණ).

## 17. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය තුල සම්බන්ධිත පාර්ශව සමග ගණුදෙනු කිසිවක් නොතිබිණ.

## 18. අසම්භාව්‍ය බැරකම්

2020 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොවීය. (2019 දෙසැම්බර් 31 දිනට - කිසිවක් නොතිබිණ.)

## 19. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනෙන් පසු සිදුවූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍යවන්නාවූ ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනෙන් පසු සිදුවී නොමැත.

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ ඇති නීතිරීති ප්‍රකාර පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- බලපත්‍රලාභී බැංකු.
- රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්.
- කල් බදු ව්‍යාපාර කටයුතු වල නිරත වී සිටින සමාගම්.
- ණය එකතුකිරීමේ සමාගම්.
- මූල්‍ය සමාගම්.
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලය පැවරූ සමාගම්.
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් සමාගම්.
- අරමුදල් කළමනාකරණ සමාගම්.
- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියාත්මකවීමට බලයලත් සමාගම්.
- කොටස් වෙළඳපලේ ලැයිස්තුගත සමාගම්.
- අනෙකුත් සමාගම්
  - (අ) රුපියල් මිලියන 500 කට වැඩි පිරිවැටුමක් ඇති සමාගම්;
  - (ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100 කට අධිකව තිබූ සමාගම්;
  - (ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී දළ වත්කම් රුපියල් මිලියන 300 කට අධිකව තිබූ සමාගම්;
  - (ඈ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100 කට වැඩි බැරකම් පැවති සමාගම්;
  - (ඉ) කාර්ය මණ්ඩලයේ සේවකයින් සංඛ්‍යාව 1,000 කට අධික සමාගම්;
- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුක්ත රාජ්‍ය සංස්ථා.
- ඉහත සඳහන් වර්ග වලින් කවර හෝ වර්ගයකට වැටෙන එක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක්. මෙම කාර්යය සඳහා සමාගම් සමූහය යන්නෙන්, සමාගම් පනත යටතේ ස්වකීය ගිණුම් ඒකාබද්ධ කළ යුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්වය**

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව
සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**

ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**

තෙවන මහල, 293, ගාලු පාර, කොළඹ 3
දුරකථන අංකය: 011 2301210 ෆැක්ස්: 011 2301211
විද්‍යුත් තැපෑල - slaasmb@sltnet.lk

**වෙබ් අඩවිය**

www.slaasmb.gov.lk

**විගණකවරුන්**

ව්‍යවස්ථාපිත විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/2, පොල්දූව පාර,
බත්තරමුල්ල

**අභ්‍යන්තර විගණකවරුන්**

එදිරිසිංහ සහ සමාගම
නො. 45, බ්‍රේබෲක් මාවත
කොළඹ 2

**බැංකුකරු**

ලංකා බැංකුව

**නීති උපදේශකවරු**

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12